# ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

2017 - සැප්තැම්බර්



කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

*''දකුණු ආසියානු රටවලට සාපේක්ෂව, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අනෙකුත් රටවල් අභිබවා ඉදිරියෙන් සිටී. කෙසේ වුවද, ළමා ශ්‍රමයෙන් තොර පරිසරයක් බිහි කිරීම සඳහා අප විසින් ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව තවත් පියවරක් ඉදිරියට තැබිය යුතු වන අතර ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් තුරන් කළ යුතුය යන මෙම ප්‍රතිපත්තිය අප ඒ කරා මෙහෙයවනු ඇත. එසේම, අප ලබාගන්නා ප්‍රතිඵල තිරසාරව පවත්වා ගැනීමට ද මෙම ප්‍රතිපත්තිය උපකාරී වනු ඇත.''*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය

අධ්‍යාපනය, සෞඛ්‍යය සහ ආරක්ෂාව ඇතුළු සෑම ක්ෂේත්‍රයක් තුළදීම යෝග්‍ය පරිසරයක් දරුවන්ට ලබා දීම සඳහා, ජාතියක් වශයෙන් අපි බැඳී සිටින්නෙමු. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, රටේ ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් අවසන් කිරීම සඳහා දායක වනු ඇති අතර, දරුවන් සඳහා සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට ද ඉවහල් වේ. මෙම ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය සමඟ අනුකූල වන අතර අධ්‍යාපනය ලබා දීමෙන් තොරව අතහැර දමනු ලැබූ කිසිඳු දරුවෙකු නොමැති බව සහතික කිරීමට උපකාරී වනු ඇත.

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ප්‍රතිපත්තිය සකස් කරන ලද නමුදු, දරුවන් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම පිළිබඳ වගකීම විවිධ ආයතන ගණනාවකට පැවරේ. මෙම ප්‍රතිපත්තිය සමඟ අනුගතව එය සාර්ථකව ක්‍රියාවට නැංවීම සහතික කිරීම සඳහා කටයුතු කරන ලෙස මම සියළු පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටිමි. මෙය සාර්ථකව ක්‍රියාවට නැංවීම ජාතික සහ පළාත් මට්ටමෙහි ප්‍රධාන ප්‍රවාහයන් මත රඳා පවතිනු ඇත.

දකුණු ආසියානු රටවලට සාපේක්ෂව, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අනෙකුත් රටවල් අභිබවා ඉදිරියෙන් සිටී. කෙසේ වුවද, ළමා ශ්‍රමයෙන් තොර පරිසරයක් බිහි කිරීම සඳහා අප විසින් ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව තවත් පියවරක් ඉදිරියට තැබිය යුතු වන අතර ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් තුරන් කළ යුතුය යන මෙම ප්‍රතිපත්තිය අප ඒ කරා මෙහෙයවනු ඇත. එසේම, අප ලබාගන්නා ප්‍රතිඵල තිරසාරව පවත්වා ගැනීමට ද මෙම ප්‍රතිපත්තිය උපකාරී වනු ඇත.

"දරුවන් සුරකිමු" ජාතික වැඩසටහනේදී ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එළි දැක්වීමට ලැබීම සතුටට කරුණක් වන අතර මෙම ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමෙහිලා සම්බන්ධ වූ සියළුම පාර්ශවයන්ට මාගේ ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**මෛත්‍රීපාල සිරිසේන**
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

*''ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපය තුරන් කිරීම සඳහා සැළකිය යුතු ශක්‍යතාවයක් ශ්‍රී ලංකාව සතු වන අතර, එම කාර්යය සඳහා කලාපය තුළ පෙරමුණ ගෙන සිටී.''*

# කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන ගරු අමාත්‍ය ඩබ්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය "ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" එළිදැක්වීම මහත් ආඩම්බරයට කරුණකි. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ ළමා ශ්‍රමය තුරන් කිරීම අරඹයා රජය විසින් පසුගිය වර්ෂ දෙක පුරා ගනු ලැබූ පියවර තවදුරටත් ව්‍යාප්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපයන් සම්පූර්ණයෙන් තුරන් කිරීම අපගේ අරමුණ වේ. ළමා ශ්‍රමයට එරෙහිව, දරුවන් එයින් ආරක්ෂා කර සුරක්ෂිත කිරීම පොදු වගකීමක් වන අතර ඒ සඳහා කණ්ඩායමක් වශයෙන් එක්ව කටයුතු කළ යුතු වන්නේය.

රටක් වශයෙන්, ළමා ශ්‍රමය උදෙසා අප විසින් සිදු කරනු ලැබූ කාර්යයන්හි ප්‍රගතිය පිළිබිඹු කිරීමට, මා මෙය අවස්ථාවක් කර ගනිමි. වර්ෂ 2015/2016 දී සිදු කරන ලද ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය අනුව, වර්ෂ 2008/2009 දී සිදු කරනු ලැබූ පූර්ව ළමා සමීක්ෂණයට සාපේක්ෂව ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය 60% කින් පහත වැටී ඇත. අනර්ථකාරී ස්වරූපයේ පසුවන දරුවන් සැළකිය යුතු ලෙස අඩු වී ඇත. ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපය තුරන් කිරීම සඳහා සැළකිය යුතු ශක්‍යතාවයක් ශ්‍රී ලංකාව සතු වන අතර, එම කාර්යය සඳහා කලාපය තුළ පෙරමුණ ගෙන සිටී.

විවිධ රාජ්‍ය ආයතනයන් සමඟ සාමූහික ප්‍රයත්නයකින් යුතුව කටයුතු කිරීම තුළින්, ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපය අවසන් කිරීම සහ එකී ප්‍රතිඵල තිරසාර කරගැනීම සඳහා දායකත්වය ලබා දීමට මෙම ප්‍රතිපත්තිය සහාය වනු ඇත. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අදාළ සම්බන්ධීකරණය සහ සමාලෝචනය කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශය විසින් ජාතික මෙහෙයුම් කමිටුව ශක්තිමත් කරනු ඇත. මෙම ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාවට නැංවීම උදෙසා වෘත්තීය සමිති සහ සේව්‍ය සංවිධාන සමඟ කටයුතු කිරීමට අප ඉදිරියේදී බලාපොරොත්තු වන්නෙමු.

මෙම නව ප්‍රතිපත්තියෙහි වර්ධනය, ළමා ශ්‍රමය සම්බන්ධ ගැටළුවලට රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන්හි අවධානය යොමු කිරීමෙහිලා මහත් උපකාරයක් වනු ඇති බව මම විශ්වාස කරමි. මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා අප්‍රතිහත උත්සාහයක් දැරූ අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත මාගේ ප්‍රශංසාව පුද කරමි.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය

*''ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, අපගේ අරමුණ පරිපූර්ණ වශයෙන් අත්පත් කර ගන්නා තුරු අඛණ්ඩව පවතින ක්‍රියාවලියක් වනු ඇත.''*

*''ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම උදෙසා අපගේ කැපවීම යළි යළිත් අවධාරණය කරමු.''*

# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු රාජ්‍ය අමාත්‍ය
# රවීන්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශනය කිරීමේදී ඒ සඳහා සුභාශිංශන පණිවුඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම මාගේ අතිමහත් සතුටට කරුණකි.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ නායකත්වය යටතේ, රජය ළමා ශ්‍රමය තුරන් කිරීමේ මෙහෙවරෙහි නොසැලී රැඳී සිටින අතර, ප්‍රතිඵල තිරසාර කර ගැනීමට කටයුතු කරයි. ආර්ථික සහ සාමාජීය වටිනාකම් දෙකින්ම යුතු ළමා ශ්‍රමය තුරන් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම අපි හඳුනා ගන්නෙමු. මව්වරුන් සිය කුඩා දරුවන් අතහැර රැකියා සඳහා මැදපෙරදිග රටවල් කරා සංක්‍රමණය වන අවස්ථාවලදී, පවුලෙහි සාමාජීය වටිනාකම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත. මෙවැනි දරුවන් පාසැල් හැර යාමේ සහ ළමා ශ්‍රමයෙහි යෙදීමේ අවධානමට ලක්ව ඇත. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, මෙසේ තමන්ගේ පවුල් සමඟ ජීවත් නොවන සහ අනාරක්ෂිත දරුවන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබයි.

ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, අපගේ අරමුණ පරිපූර්ණ වශයෙන් අත්පත් කර ගන්නා තුරු අඛණ්ඩව පවතින ක්‍රියාවලියක් වනු ඇත. මෙම ප්‍රතිපත්තිය මඟින් අනර්ථකාරී කාර්යයන්හි නියැලෙන දරුවන් ද ඇතුළුව ළමා ශ්‍රමයෙහි නිරත වයස අවුරුදු 18 ට අඩු දරුවන් 50,000 කට පමණ ඍජුව ප්‍රතිලාභ හිමි වනු ඇත.

මෙම ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමෙහිලා කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන ගරු අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා සහ අමාත්‍යාංශ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් දරනු ලැබූ උත්සාහයට මාගේ කෘතඥතාවය පළ කරනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම උදෙසා අපගේ කැපවීම යළි යළිත් අවධාරණය කරමු.

**රවීන්ද්‍ර සමරවීර**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය

*''මේ සම්බන්ධයෙන් දරණ ලද උත්සාහය දරුවන්හට අධ්‍යාපනයට ප්‍රවේශ වීමට පවතින බාධක ඉවත් කිරීම සඳහා සහාය වන අතර රටෙහි සංවර්ධනය සඳහා වන වටිනා ආයෝජනයකි. සත්‍ය වශයෙන්ම, ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහතික කිරීම සඳහා, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රතිපත්තියක් පැවතීම වැදගත් වේ.''*

# පෙරවදන සහ ස්තුතිය

වැඩ ලෝකය තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ යහපත් පරිචයන් දරුවන්ට වඩා හොඳ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායක වේ. විවිධ පාර්ශවකරුවන් හරහා මතු වූ හඬෙහි ප්‍රතිඵලයක් වශයෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ කතිකාව වර්තමානයේදී අඛණ්ඩව අවධානයට යොමු කෙරේ. මේ සම්බන්ධයෙන් දරණ ලද උත්සාහය දරුවන්හට අධ්‍යාපනයට ප්‍රවේශ වීමට පවතින බාධක ඉවත් කිරීම සඳහා සහාය වන අතර රටෙහි සංවර්ධනය සඳහා වන වටිනා ආයෝජනයකි. සත්‍ය වශයෙන්ම, ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහතික කිරීම සඳහා, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රතිපත්තියක් පැවතීම වැදගත් වේ. මේ අනුව කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය ළමා ශ්‍රමය මුලිනුපුටා දැමීම සඳහා වූ ක්‍රියාකාරී සහ නිවාරණ පියවර විධිමත් කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කර ඇත.

මෙම ජාතික ප්‍රතිපත්තිය වගකිවයුතු රාජ්‍ය ආයතන, සේව්‍ය හා සේවක සංවිධාන සහ ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ සියළුම සාමාජිකයන් සම්බන්ධ වෙමින්, ත්‍රෛයිපාර්ශවීය උපදේශන ක්‍රියාවලියක් මඟින් සම්පාදනය කරනු ලැබ ඇත. මෙම ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය උදෙසා, ප්‍රධාන පාර්ශවකරුවන් අතර පවතින ශක්තිමත් සම්බන්ධීකරණය ඉතා වැදගත් වන අතර එහි ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා, ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින්ගේ උපදේශකත්වය සහිතව ඵලදායීව ක්‍රියාවට නැංවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරෙනු ඇත.

මෙම ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ සමස්ථ ක්‍රියාවලිය පුරා නායකත්වය ලබා දෙමින් මඟ පෙන්වූ කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන ගරු අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා සහ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු රාජ්‍ය අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා වෙත මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් විසින් ලබා දුන් දායකත්වය පිළිබඳව මා කෘතඥපූර්වක වන අතර, ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ එක්සත් ජනපද කම්කරු දෙපාර්තමේන්තුව (USDOL) විසින් අප වෙත ලබා දුන් තාක්ෂණික සහ මූල්‍ය සහාය සම්බන්ධයෙන් මාගේ විශේෂ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක ආර්. පී. විමලසේන මහතා සහ මෙම කර්තව්‍යය සඳහා සම්බන්ධව කටයුතු කළ අමාත්‍යාංශයේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වෙත ද කෘතඥතාව පළ කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

**එස්. ඒ. නිමල් සරණතිස්ස**

ලේකම්

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

# පටුන


| | පිටු අංක |
|---|---|
| සාරාංශය | 01 |
| **1. ප්‍රතිපත්තිය සඳහා පසුබිම** | **05** |
| **2. ළමා ශ්‍රම තත්ත්වය** | **06** |
| **3. නෛතික හා ප්‍රතිපත්ති කාර්යරාමුව** | **07** |
| 3.1 නෛතික කාර්යරාමුව | 07 |
| 3.2 ප්‍රතිපත්ති පසුබිම | 09 |
| **4. ප්‍රතිපත්ති පරමාර්ථ** | **10** |
| **5. ප්‍රතිපත්තියෙහි විෂය පථය** | **10** |
| **6. ප්‍රතිපත්තියෙන් ප්‍රතිලාභ ලබන්නන්** | **11** |
| **7. ක්‍රියාත්මක කිරීම** | **11** |
| 7.1 ආයතනික ව්‍යුහයන් සහ යාන්ත්‍රණ | 11 |
| 7.2 පළාත්වල සහ දිස්ත්‍රික්කවල සම්බන්ධීකරණය | 12 |
| 7.3 සේව්‍ය හා සේවක සංවිධාන සමඟ හවුල්කාරත්වය | 13 |
| 7.4 පෞද්ගලික අංශය සමඟ හවුල්කාරත්වය | 13 |
| **8. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිමෙහිලා ප්‍රධාන උපාය මාර්ග** | **14** |
| 8.1 පුළුල් වූ ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සන්දර්භයක් තුළ නව ප්‍රවේශයක් ගොඩනැඟීම | 14 |
| 8.2 සේවා නියුක්තිය සඳහා වූ අවම වයස වැඩිකිරීමට ප්‍රයත්න දැරීම | 14 |
| 8.3 අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම | 14 |
| 8.4 සේවා නියුක්ති කොන්දේසි බලාත්මක කිරීම | 15 |
| 8.4.1 තරුණ පුද්ගලයින් පුහුණු කිරීම | 15 |
| 8.4.2 අන්තර් හා අභ්‍යන්තර නියෝජිතායතන ආශ්‍රිත සහයෝගිතා යාන්ත්‍රණ | 15 |
| 8.5 බලාත්මක පද්ධතිය ශක්තිමත් කිරීම | 15 |
| 8.5.1 පුහුණුව | 15 |
| 8.5.2 වයස තහවුරු කිරීම | 15 |
| 8.5.3 කම්කරු පරීක්ෂණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශය | 15 |
| 8.5.4 නඩු පැවරීම කාර්යක්ෂම කිරීම හා දඬුවම් පැමිණවීම | 16 |
| 8.6 පැමිණිලි ක්‍රියාපටිපාටීන් පවත්වා ගැනීම | 16 |
| **9. සන්නිවේදනය - ළඟාවීම හා පසුවිපරම** | **16** |
| **10. සම්පත්** | **16** |
| **11. සමාලෝචනය සහ ඇගයීම** | **17** |
| **12. අවදානම් සහ අභියෝග** | **17** |
| **13. ප්‍රතිපත්ති සම්පාදනයේ බාධා** | **18** |
| **14. කාල සීමාව** | **18** |
| ඇමුණුම - 1 | 19 |

# සාරාංශය

ළමා ශ්‍රමය වැළැක්වීමට සහ තුරන් කිරීමට තුඩු දෙන ක්‍රියාමාර්ග ඇතුළු, ළමයින් හා තරුණ පුද්ගලයන් සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකාවේ ආංශික බැඳියාවක් සහිත පූර්ණ සක්‍රීය බවකින් යුක්තව ක්‍රියාත්මක කිරීමෙහිලා අනුගමනය කිරීම පිණිස කාර්යරාමුවක් සපයනු ලබන්නා වූ පහසුවෙන් අවබෝධ කර ගත හැකි සහ ප්‍රායෝගික ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ උපාය මාර්ගික සැලැස්ම-2016 (Road map - 2016) (ළමා ශ්‍රමය ශූන්‍ය කිරීම සඳහා එක් එක් කාර්යභාරය නියම කෙරෙන වැඩසටහන), ළමයින් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2010-2014), ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් තුරන් කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම-2004 (කෙටුම්පත), ශ්‍රී ලංකාවේ ශ්‍රමය සූරාකෑම සඳහා ළමයින් නීති විරෝධී ලෙස යෙදවීමට එරෙහි වීම පිණිස වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම-2001 සහ වෙනත් සෙසු සැලසුම් ඇතුළු ළමයින් පිළිබඳ විවිධවූත් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධවූත්, ජාතික ක්‍රියාකාරී සැලසුම් ශ්‍රී ලංකාව සතු වේ. ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපයන් තුරන් කිරීමෙහිලා වූ ජාතික ක්‍රියාකාරී සැලස්ම-2004 කෙටුම්පතෙහි මූලිකාංගයන්, ළමයින් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි (2004-2008 සහ 2010-2014) ඒකරාශී කර ඇත.

ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් මඟින් පහසුවෙන් අවබෝධ කර ගත හැකි, සහයෝගී සහ වගකිව යුතු ක්‍රියාමාර්ග මෙන්ම එකී ක්‍රියාමාර්ගවලට මඟ පෙන්වීම සඳහා වූ මූලධර්ම සහ පෘථුල දැක්මක් සහ වගකීමක් සලසා දී තිබේ. ඒ නිසා විශේෂයෙන්, අවිධිමත් අංශය සඳහා පදනමක් වශයෙන් ද රජය හා පෞද්ගලික අංශය විසින් වගකිව යුතු වෘත්තීය කටයුතුවල නියැලීමේ පදනමක් වශයෙන් ද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාකරනු ඇත. සැලසුම්ගත ප්‍රතිපත්තියක් මඟින්, ළමා ශ්‍රමය වැළැක්වීම හා තුරන් කිරීම පිණිස වූ වැඩසටහන් වෙනුවෙන් සම්පත් වෙන් කිරීම, ප්‍රධාන වගකීම් පවතින අවස්ථාවේදී ඒවා විස්තර කිරීම සහ ක්‍රියාමාර්ග ගැනීම පිණිස පරාමිතික නිශ්චිත වශයෙන් දැක්වීම සඳහා ප්‍රඥාගෝචර පදනමක් සලසාලනු ලබන අතර, ප්‍රගතිය ඇගයීම හා වගවීම පිළිබඳ තක්සේරු කිරීම පිණිස පදනමක් සලසනු ලබයි.

ශ්‍රී ලංකා රජය, 1973 අංක 138 දරණ සේවා නියුක්තිය සඳහා වූ අවම වයස පිළිබඳ සම්මුතිය සහ 1999 අංක 182 දරණ ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ සම්මුතිය යන ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුති පිළිගෙන තිබේ. 2010 වර්ෂයේ දී, සේව්‍ය හා සේවක සංවිධාන සමඟ සාකච්ඡා කර සකස් කරන ලද අනතුරුදායක රැකියා පිළිබඳ රෙගුලාසි පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. එය 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත යටතේ ප්‍රසිද්ධියට පත් කරන ලද අතර, එමඟින් ළමා ශ්‍රමයේ හානිකර ස්වරූපයන් 51 ක් හඳුනා ගන්නා ලදී. ඇතැම් අංශවල සේවා නියුක්තිය සඳහා වූ අවම වයස වැඩි වී තිබෙන අතර, නව අධ්‍යාපන ප්‍රතිපත්තිය මඟින් අනිවාර්ය අධ්‍යාපන වයස අවුරුදු 16 දක්වා වැඩි කර ඇත. මෙම වෙනස් කිරීම සඳහා කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයේ සහාය ලබා දෙන ලදී.

දකුණු ආසියාවේ අනෙකුත් රටවල් සමඟ සසඳන විට ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය පිළිබඳ ගැටළුව උග්‍ර නොවූවද, රටේ වේගවත් හා සංවර්ධන න්‍යාය පත්‍ර මඟින් ළමා ශ්‍රමයට ළමයින් ගොදුරුවීමේ ප්‍රවණතාව වැඩිවීමට දායකත්වයක් සැපයෙන බව හඳුනා ගැනීම නිසා ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපය අවසන් කිරීමේ හදිසි අවශ්‍යතාව ඉහළ ගොස් තිබේ.

අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි ප්‍රධාන රාජ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය, අදාළතාව හා තිරසාරත්වය සපුරා ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීමේ වැදගත්කම රජය හඳුනා ගෙන ඇත. කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය මෙන්ම තරුණ රැකියා නියුක්තිය ඉහළ නැංවීම ද අභියෝගයකි. කුඩා ළමයින් සිටින මව්වරුන් රැකියා සඳහා මැදපෙරදිග බලා සංක්‍රමණය වන විට, පවුල සඳහා වන සමාජ පිරිවැයෙහි ඉහළ යාමක් ඇති වන බව හඳුනාගෙන ඇත. එම තත්ත්වය ළමයින් පාසැල්වලින් බැහැර වී ළමා ශ්‍රමයෙහි නිරතවීමේ ගොදුරු බවට පත්වීමට එක් හේතුවකි. මින් පැහැදිලි වන්නේ කිසිඳු තනි ආයතනයකට තනිවම ළමා ශ්‍රමය තුරන් කළ නොහැකි බවය.

**ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ පරමාර්ථය වන්නේ,** ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ ජාතික හා පළාත් මට්ටම්වල දී සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීම, නීතිය සඵලදායී ලෙස බලාත්මක කිරීම, ප්‍රධාන සංවර්ධන ප්‍රතිපත්ති හා වැඩසටහන් තුළට ළමා ශ්‍රමය පිළිබඳ ගැටළු ඇතුලත් කිරීම සහ ශ්‍රී ලංකාවේ යෞවනයන් සඳහා තිරසාර ජීවන ප්‍රවේශයක් ප්‍රවර්ධනය කර ඒ සඳහා පහසුකම් සැපයීම තුළින් ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයට ප්‍රමුඛතාවය ලබා දෙමින් ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම හා එහි ප්‍රතිඵල තිරසාරව පවත්වා ගෙන යාමයි.

කම්කරු අමාත්‍යාංශයේ විෂය පථය සැලකූ විට, **මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාවට නැංවීමේ උපාය මාර්ගය විය යුත්තේ** ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන උපාය මාර්ග තුළට ළමා ශ්‍රමය පිළිබඳ ගැටළුව ඇතුලත් කිරීමයි. මෙහිදී රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහභාගිත්වය අත්‍යවශ්‍ය වේ.

ළමුන් විකිණීම (සියළු ස්වරූපයෙන්) සහ ජාවාරම් සඳහා යොදා ගැනීම, බලහත්කාරයෙන් හෝ අනිවාර්ය බඳවා ගැනීම, අයථා ක්‍රියාකාරකම් ඇතුළු බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් ශ්‍රමය ලබා ගැනීම, ගණිකා වෘත්තිය, අසභ්‍ය නිෂ්පාදන හෝ අසභ්‍ය රඟ දැක්වීම් සඳහා ළමුන් යොදා ගැනීම, ලබා ගැනීම හෝ ලබාදීම, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ විකිණීමේ අයථා ක්‍රියාකාරකම් සඳහා ළමයෙකු යොදා ගැනීම, ලබා ගැනීම හෝ ලබාදීම, සියළු ස්වරූපයේ නීති විරෝධී වෙළෙඳාම් කටයුතුවල නිරතව සිටින ළමයින් මෙන්ම අනතුරුදායක කාර්යයන්හි නිරතව සිටිනු ඇතැයි කියනු ලබන ළමයින් ඇතුළු ළමා ශ්‍රමය පිළිබඳ සමීක්ෂණය මඟින් ඇස්තමේන්තු කර ඇති අවුරුදු 18 ට අඩු 100,000 ක් පමණ වූ ළමයින් මෙම ප්‍රතිපත්තියෙහි **සෘජු ප්‍රතිලාභීන්** වශයෙන් සලකනු ලැබේ.

**වක්‍ර ප්‍රතිලාභ වශයෙන්** තරඟකාරී හා දක්ෂතා සහිත ශ්‍රම බලකායකින් සමන්විත ව්‍යාපාර පැවතීම, ළමා ශ්‍රමයෙන් තොර තිරසාර වූ පාලන පද්ධතියක් බිහිවීම දැක්විය හැකිය.

## ක්‍රියාත්මක කිරීම

***ආයතනික ව්‍යුහය, යාන්ත්‍රණය හා සම්බන්ධීකරණය :***
ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ, අධීක්ෂණය කිරීමේ හා වාර්තා කිරීමේ මූලික වගකීම කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව සතු වේ. ප්‍රතිපත්තිය සාර්ථක වනු පිණිස එය දේශීය සන්දර්භය තුළ ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමෙහිලා තුඩු දිය හැකි පුළුල් පරාසයක වූ හවුල්කරුවන් හා පාර්ශවකරුවන් විසින් ඔවුන්ගේ වැඩසටහන් තුළ අන්තර්ගත කළ යුතුය. ඒ සඳහා ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරී මට්ටමින් ආයතන අතර තිරස්ව හා සිරස්ව සම්බන්ධීකරණය සහතික කෙරෙනු ඇත.

කම්කරු අමාත්‍යාංශය ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කරනු ඇති අතර එම කමිටුව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ "ලේකම් කාර්යාලය" වශයෙන් ක්‍රියාකරනු ඇත. තවද, එය පළාත් හා දිස්ත්‍රික් ව්‍යුහයන් සමඟ මෙන්ම වෙනත් සහයෝගී හවුල්කරුවන් සමඟ සමීපව කටයුතු කරයි. එසේම දිස්ත්‍රික්ක 25 හි ළමා ශ්‍රමය පිළිබඳ තත්ත්වයන් අධීක්ෂණය කිරීම සඳහා මෙන්ම එකී තත්ත්වය තක්සේරු කිරීම සඳහා ද වගකියනු ඇත.

පළාත් මට්ටමේදී, ළමා ශ්‍රමය සම්බන්ධ වැදගත් කරුණු සහ ප්‍රතිචාර ස්වකීය සැලසුම්වලට ඒකාබද්ධ කරමින්, ළමා ශ්‍රමයට එරෙහිව සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග සහතික කිරීම පළාත් ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ඇත.

දිස්ත්‍රික්ක මට්ටමේදී, ළමයින්ට අදාළ ක්‍රියාමාර්ග සඳහා වූ සම්බන්ධීකරණ කාර්යභාරය, දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව විසින් ඉටු කරයි. ළමා ශ්‍රමයට එරෙහි සම්බන්ධීකරණ ක්‍රියාමාර්ගවලට සහාය දැක්වීම සඳහා දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුවලට හැකියාවක් ඇත. දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සභාපතිත්වය උසුලනු ලබන දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව විසින් ළමා ශ්‍රමය තුරන් කිරීම, දිස්ත්‍රික් සංවර්ධන සැලසුම්වල ප්‍රධාන ප්‍රවාහයට එකතුකිරීම සහ දිස්ත්‍රික්ක මට්ටම්වල ඉලක්ක සඳහා ප්‍රවේශවීමට ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය පහසුකම් සැපයීම සහතික කරනු ලැබේ.

එක් එක් දිස්ත්‍රික්කය ළමා ශ්‍රමය තුරන් කිරීමේ තත්ත්වයන්ට ළඟා වූ විට, එකී තත්ත්වය තක්සේරු කරනු ලබන අතර ක්‍රමවේදයන් තහවුරු කිරීම මෙම ඒකකය මඟින් සිදු කරනු ලැබේ. අනතුරුව, මෙම ඒකකය විසින් එක් එක් දිස්ත්‍රික්කය "ළමා ශ්‍රමයෙන් තොර බවට" සහතික කරනු ඇත.

පළාත් හා දිස්ත්‍රික්ක මට්ටම්වලදී ක්‍රියාකාරී මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය. ළමා ශ්‍රමය පිළිබඳ එවැනි මධ්‍යස්ථාන නිලධාරීන් ස්වකීය පළාත් සහ දිස්ත්‍රික්කවල, පළාත් සහ දිස්ත්‍රික් පරිපාලනයන් විසින් පත් කෙරෙනු ඇත. වැඩසටහන් හරහා ගැටළු ප්‍රධාන ප්‍රවාහයට එකතු කිරීම සහ ගනු ලබන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වූ

ආයතනික සම්බන්ධීකරණයට, ළමා සංවර්ධන කමිටු සමඟ ඔවුන් සහයෝගීව කටයුතු කරති.

එක් එක් පළාත හා දිස්ත්‍රික්කය, කම්කරු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව, එකී දිස්ත්‍රික්ක විසින්ම එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය දක්වන වඩාත් ශක්‍යතාවයෙන් යුක්ත, ඵලදායි හා යෝග්‍යතම ස්ථානය වශයෙන් සකස් කරනු ඇත.

***සේව්‍ය හා සේවක සංවිධාන සමඟ හවුල්කාරත්වය :***
ළමා ශ්‍රමය අවසන් කිරීමේදී හා වැළැක්වීමේදී මෙන්ම නීත්‍යානුකූල වැඩ කිරීමේ වයසේ තරුණ කම්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමේදී සේව්‍ය හා සේවක සංවිධානවලට ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා වූ ඔවුන්ගේ ජාල හරහා ඉටු කළ යුතු වැදගත් කාර්යභාරයක් හා වගකීමක් පවතී. එහිදී ළමා ශ්‍රමය පිළිබඳ ගැටළුව ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රවාහයට ඇතුලත් කිරීමේ දී සේව්‍ය හා සේවක සංවිධානවල කාර්යභාරය තීරණාත්මක සාධකයක් වේ. මේ සම්බන්ධයෙන් පුහුණුව හා ඉලක්ක ඇතුලත් වූ විශේෂිත ක්‍රියාමාර්ග, කම්කරු අමාත්‍යාංශය හා ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ සේව්‍ය හා සේවක සංවිධානවල නියෝජිතයන් විසින් හඳුනාගනු ලබන අතර, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් ද සපයනු ලබයි.

***පෞද්ගලික අංශය සමඟ හවුල්කාරත්වය :***
විධිමත් හා අවිධිමත් සැපයුම් දාමය තුළ බාලවයස්කරුවන් නොමැතිව උගත් හා සුදුසුකම්ලත් ශ්‍රම බලකායක් ගොඩනැංවීම සඳහා දායකත්වය සපයන පෞද්ගලික අංශයට, ඒ ඒ ක්ෂේත්‍රයන්හි, ප්‍රතිපත්ති හා පියවර ක්‍රියාවට නැංවීමේදී ඒවා ජාතික නීති රීති හා ආචාර ධර්ම සංග්‍රහ හෝ සම්මුතිවලට අනුකූල බවට සහතික කිරීම සඳහා වගකීමක් පවතී. ඒ තුළින්, ශ්‍රී ලංකාවට තරඟකාරීත්වයක් ඇති කර ගත හැකිය.

කම්කරු අමාත්‍යාංශය විසින් ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවෙහි සේව්‍ය හා සේවක නියෝජිතයන් සමඟ සාකච්ඡා කර, පුහුණුව ඇතුළු යෝජිත පියවරයන් හා ඒ සම්බන්ධයෙන් වන ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

***සම්පත් :***
කම්කරු අමාත්‍යාංශය හා ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් යටතේ අරමුදල් සපයා ගැනීමේ ක්‍රියාමාර්ග සහ අදාළ නියෝජිතායතනයන්හි අයවැය මෙන්ම ළමා ශ්‍රමය තුරන් කිරීම හා එකී ළමයින් හා පවුල් දිගුකාලීනව පුනරුත්ථාපනය කිරීම සඳහා අතිරේක අයවැය වෙන්කිරීම වෙනුවෙන් ක්‍රියා කරනු ඇත. කම්කරු, කෘෂිකර්ම, වැවිලි, අධ්‍යාපන, සංචාරක හා ධීවර කටයුතු යන අමාත්‍යාංශ, ජාතික මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරන ලද හා ඉල්ලා සිටිනු ලබන ප්‍රතිපාදන එම අමාත්‍යාංශයන්හි අයවැය තුළින් වෙන් කිරීම් සිදු කරනු ඇත.

## ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රධාන උපායමාර්ග

*පුළුල් වූ ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ප්‍රවාහය හා ක්‍රියාමාර්ග සන්දර්භය*

අපේක්ෂා කරන ප්‍රතිඵල සපුරා ගැනීමේ උපාය මාර්ගය වන්නේ මුඛ්‍ය ධාරා උපාය මාර්ගයයි. එමගින් ළමා ශ්‍රමය පිළිබඳ සංසිද්ධියෙහි බොහෝ ගැටළු සඳහා ඒකාබද්ධ හා සම්පූර්ණ ප්‍රතිචාර දක්වනු ලැබීම පිණිස ළමයින්ගේ හා තරුණ පුද්ගලයන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන්, ජාතික සංවර්ධන ප්‍රතිපත්ති, ඔවුන්ගේ ඒ ඒ වැඩසටහන් හා අයවැය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාවට නැංවීමේ දී යොදා ගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් ඇති වැදගත්කම, ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය-2012, තරුණ සේවා නියුක්තිය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම-2006, ''සමෘද්ධිය'' වැනි සමාජ සුභසාධන ව්‍යාපෘති, අධ්‍යයනය හා වෘත්තීය අනුගත වීම සඳහා යෝග්‍ය හා ප්‍රමාණවත් පහසුකම් සැලසීම, සේවයේ නියුක්ත කරන පුද්ගලයන් ඇතුළු ළමයින්ගේ හා තරුණ පුද්ගලන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහ ඔවුන්ගේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිණිස යෝග්‍ය හා ප්‍රමාණවත් පහසුකම් සැලසීම යනාදිය මගින් ද තහවුරු කරනු ලබයි.

ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමෙහිලා වූ ප්‍රධාන උපායමාර්ගවලට අන්තර්ගත කාර්යයන්:

- අධ්‍යාපනය සම්පූර්ණ වීම සඳහා වූ වයස හා සේවා නියුක්තිය සඳහා වූ අවම වයස අතර අනුකූලතාව සාක්ෂාත් කර ගැනීම.
- අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ශක්තිමත් කිරීම සහ ඒ පිළිබඳ දැනුවත්භාවය හා නඩු පැවරීමේ ක්‍රියාපටිපාටිය ශක්තිමත් කිරීම.

- සේවා නියුක්ති කොන්දේසි බලාත්මක කිරීම සහ භාවිතය, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හා මූල්‍යමය කැපවීම තුළින් අවිධිමත් සේවා ස්ථානවලට ද ප්‍රවේශ විය හැකි පරිදි කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය හා එහි බලපෑම පුළුල් කිරීම.
- ළමා ශ්‍රමය තුරන් කිරීමේ කාර්යය පිණිස තරුණ පුද්ගලයන් පුහුණු කිරීම.
- 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනතේ චේතන හා ප්‍රතිලාභ සඳහා වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීම වර්ධනය.
- නියෝජිතායතන තුළ සහ ඒ අතර සහයෝගිතා යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම.
- 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත සහ අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි හා වෙනත් අදාළ ව්‍යවස්ථාපිත නීතිරීති ඵලදායි ලෙස යොදා ගැනීම තුළින් විශේෂයෙන්ම වෙනත් පියවර අතර පුහුණුව, වයස තහවුරු කිරීම, කම්කරු පරීක්ෂණ සඳහා වූ ඒකාබද්ධ ප්‍රවේශය, ඵලදායි ලෙස නඩු පැවරීම් හා දඩ සහ පැමිණිලි ක්‍රියාපටිපාටියක් පවත්වාගෙන යාම තුළින් බලාත්මක කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම.
- සන්නිවේදන ජාලය සංවර්ධනය කිරීම.

ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් ගැහැනු ළමයින්ගේ, යෞවනයන්ගේ, සංක්‍රමණිකයන්ගේ හෝ නීතිවිරෝධී කටයුතුවලට යොදා ගැනෙන සහ ස්වකීය පවුල් සමඟ ජීවත් නොවන්නා වූ ළමයින් හා අනාරක්ෂිත ළමයින්ගේ තත්ත්වය පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරෙයි.

**සන්නිවේදනය - ප්‍රවේශ වීම හා ප්‍රතිචාර :**
ළමා ශ්‍රමය පිළිබඳ ඵලදායි සන්නිවේදනයක් ඇතිකර ක්‍රියාත්මක කරනු ඇත. පවතින ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති අදාළ හා ඵලදායි වන බවට සහතික වීම පිණිස පසුවිපරම් කිරීම සඳහා විශේෂ අවධානයක් යොදනු ඇත.

**සමාලෝචනය හා ඇගයීම :**
ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල සමාලෝචනය කිරීම සඳහා පළාත් හා දිස්ත්‍රික්කවල, පළාත් ලේකම්වරුන් හා දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුවලින් සමන්විත සන්නිවේදන ජාල හරහා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා වූ අභ්‍යන්තර සමාලෝචනය වාර්ෂික පදනමක් මත කම්කරු අමාත්‍යාංශය මඟින් සිදුකරනු ඇත. ඒ මඟින් ප්‍රතිපත්තියෙහි ගමන් මග සඳහා වූ යම් වෙනසක් ඇතුළු සොයා ගනු ලබන කරුණු හා නිර්දේශ අවම මට්ටමකින් ජාතික මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

ළමා ශ්‍රම තත්ත්වය පිළිබඳ ඇස්තමේන්තු හා තොරතුරු සපයන ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණවලින් හා වෙනත් සමීක්ෂණවලින් සොයා ගනු ලබන කරුණු තුළින් අභ්‍යන්තර සමාලෝචනය ප්‍රතිලාභ ලබනු ඇත.

**අවදානම් හා අභියෝග :**
ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය රඳා පවතින්නේ අවදානම් හා අභියෝග අවබෝධ කර ගැනීම හා කළමනාකරණය කර ගැනීම මතය. විශේෂයෙන්ම, ඇතැම් කණ්ඩායම් හා ආයතන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මූලික අදියරවලදී අවදානම් හා අභියෝගවලට මුහුණ දෙයි. මීට ඇතුලත් වන කණ්ඩායම් හා ආයතන නම්, රේඛීය දෙපාර්තමේන්තු හා නියෝජිත ආයතන, සේවායෝජකයන්, පවුල්, පාසැල්, ගුරුවරුන් හා පරිපාලකයන්, සේවා ස්ථාන, ප්‍රජාවන්, කුසලතා පුහුණු සපයන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, සේවා සපයන්නන් ආදියයි.

**කාල සීමාව :**
ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, එහි අරමුණු සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ගන්නා තෙක් සිදු කරගෙන යමින් පවතින්නා වූ ක්‍රියාවලියක් වනු ඇත. එකී ක්‍රියාවලිය ජාතික මෙහෙයුම් කමිටුව විසින් අවශ්‍ය යැයි සැලකෙන පරිදි හා රජය මඟින් අනුමත කෙරෙන පරිදි සංශෝධනය, නවීකරණය හා යාවත්කාලීන කරනු ඇත.

# 01

## ප්‍රතිපත්තිය සඳහා පසුබිම

දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල අත්විඳ ඇති ආකාරයට, ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රම ගැටළුව පුළුල් ලෙස පැතිරී නොමැත. කෙසේ වුවද පවතින සමාජ, දේශපාලන වාතාවරණය හා රටේ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගත හැකි වන්නේ ළමා ශ්‍රමය, එහි වඩාත්ම අනර්ථකාරී ස්වරූපයන් (1 කොටුව), සියළු වගකීම් දරන්නන් හා පාර්ශවකරුවන් විසින් ප්‍රතිපත්තිය සක්‍රීය කිරීමෙන් හා තිරසාර ක්‍රියාමාර්ග ගැනීමෙන් සාමූහිකව විසඳීමෙන්ම පමණි.

| 1 කොටුව: අංක 182 දරණ ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතියට අනුව ළමා ශ්‍රමයේ වඩාත් අනර්ථකාරී ස්වරූප |
|---|
| ශ්‍රී ලංකාව විසින් පිළිගනු ලැබූ, 1999 අංක 182 දරණ ළමා ශ්‍රමයේ වඩාත් අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතියෙහි 3 වැනි ව්‍යවස්ථාවෙහි වඩාත් අනර්ථකාරී ස්වරූප වර්ග කර ඇත්තේ මෙසේය.<br>(අ) සන්නද්ධ අරගලවලදී යොදා ගැනීම පිණිස ළමයින් බලහත්කාරයෙන් හෝ අනිවාර්ය බඳවා ගැනීම ඇතුළු (සියළු ආකාරයේ) වහල්භාවයන් හෝ ළමයින් විකිණීම හෝ නීති විරෝධී කටයුතුවලට යොදා ගැනීම, ණය හිලවු පිණිස ළමයින් දාසභාවයට ගැනීම සහ බලහත්කාරයෙන් වැඩ ගැනීම හෝ අනිවාර්ය ශ්‍රමය වැනි වහල්භාවයට සමාන පරිචයන්;<br>(ආ) ගණිකා වෘත්තිය, අසභ්‍ය නිෂ්පාදන හෝ අසභ්‍ය රංගන සඳහා ළමයෙකු යොදා ගැනීම, මුදලට ගැනීම හෝ ලබාදීම;<br>(ඇ) තහනම් ක්‍රියාකාරකම් විශේෂයෙන්ම, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය හා නීතිවිරෝධී ලෙස මිලට ගැනීම හෝ විකිණීම සඳහා ළමයෙකු යොදා ගැනීම, මුදලට ගැනීම හෝ ලබාදීම;<br>(ඈ) වැඩෙහි ස්වභාවය හෝ එය සිදු කරගෙන යනු ලබන තත්ත්වයන් අනුව ළමයින්ගේ සෞඛ්‍යයට, සුරක්ෂිතභාවයට හෝ සදාචාරයට හානිවිය හැකි වැඩ. |

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 27 (13) වගන්තිය රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම මඟින් ළමයින්ගේ පූර්ණ ශාරීරික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සාමාජීය සංවර්ධනය පමණක් නොව ශ්‍රමය සූරාකෑමෙන් හෝ වෙනස් කර සැලකීමෙන් ඔවුන් ආරක්ෂා කිරීම සහතික වන පරිදි ළමයින්ගේ හා තරුණයන්ගේ යහපත පිළිබඳව විශේෂ අවධානයක් සහිතව ප්‍රවර්ධනය කිරීම පිණිස රජයේ වගකීම හඳුනාගනු ලබයි.

1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත මඟින් ළමයින්ගේ හා තරුණ පුද්ගලයන්ගේ වැඩ, වැඩකරන පැය ගණන හා අදාළ කොන්දේසි නියාමනය කරනු ලබන අතර, 2010 වර්ෂයේ අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි මඟින් අනතුරුදායක වෘත්තීන්හි යෙදවීම තහනම් කරනු ලබයි. 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත, 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥා පනත, 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත, 1923 අංක 01 දරණ ඉන්දියානු සංක්‍රමණික කම්කරු ආඥා පනත වැනි වෙනත් පනත් මඟින් ද, වයස අවුරුදු 14 ට අඩු ළමයින් සේවයේ යෙදවීම තහනම් කරනු ලබයි. මීට අමතරව, වෙනත් නීති ගණනාවක් මඟින් රටේ ළමා ශ්‍රම තත්ත්වය පිළිබඳව සෘජුව හෝ වක්‍රව ආවරණය කරනු ලබයි.

| 2 කොටුව: 1956 අංක 47 දරණ පනත අනුව, ළමයින් හා තරුණ පුද්ගලයන් පිළිබඳ නිර්වචනය |
|---|
| 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත මඟින් ළමයෙකු යනු වයස අවුරුදු 14 ට අඩු තැනැත්තෙකු වශයෙන් ද, තරුණ පුද්ගලයෙකු යනු වයස අවුරුදු 14 ට එළඹී ඇති එහෙත් අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු වශයෙන් ද නිර්වචනය කරනු ලබයි. |

ළමා ශ්‍රමය පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීමට හැකි පරිසරයක් ඇති කිරීමෙහිලා නීති මඟින් දායකත්වය සපයනු ලබන අතර ඒවා ක්‍රියාවෙහි යෙදවීම අසීරු මෙන්ම විශේෂයෙන්, නඩු පැවරීම, පිළිගත හැකි සාක්ෂි අරක්ෂා කිරීම, සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහ කාර්යක්ෂම හා ළමා හිතකාමී වන අයුරින් බාලාපරාධ අධිකරණ ක්‍රියාමාර්ග සහතික කිරීම සම්බන්ධයෙන් අභියෝගවලට මුහුණදීමට සිදු වේ.

ළමා ශ්‍රමයෙහි සියළු ස්වරූපයන් තුරන් කිරීම හා වැළැක්වීම උදෙසා ක්‍රියාකරන අතරම, 2010 වර්ෂයේදී රජය, ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව[1] ශ්‍රී ලංකාවේ සේවායෝජක සංවිධාන හා වෘත්තීය සමිති හා ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ එක්ව වඩාත් අනර්ථකාරී ස්වරූපයන් නොපමාව අවසන් කිරීමට ඔවුන්ගේ කැපවීම පෙරට වඩා ශක්තිමත්ව යෙදවීය.[2] පරමාර්ථ සපුරා ගැනීමට සහාය වනු පිණිස ක්‍රියාකාරී වැඩසටහන් සහ සමස්ත උපායමාර්ග හඳුනාගැනීම ඇතුළුව 2010 වර්ෂයේ රෙගුලාසි හා උපාය මාර්ගික සැලසුම් (Road map) සංවර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති සන්දර්භය බල ගන්වා ප්‍රධාන ප්‍රවාහයට එක්කෙරිණි. තෝරාගත් ජාතික හා ආංශික ප්‍රතිපත්ති සහ ළමා ශ්‍රමය කෙරෙහි බලපෑම් ඇති කරන විශ්ලේෂණයට භාජනය කෙරුණු වැඩසටහන් ප්‍රධාන ප්‍රවාහයට එක්කිරීමේ මූලික ප්‍රයත්නයන් සඳහා නිර්දේශ මගින් මඟ පෙන්විණි. එපමණක් නොව, පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් ද සැකසී තිබුණි.

ජාත්‍යන්තර සම්මුතීන් පිළිගැනීම හා ඒවායෙහි අඩංගු කරුණු ක්‍රියාවෙහි යෙදවීම, උපායමාර්ග, උගත් පාඩම් හා යහපත් පරිචයන් පිළිබඳ ගෝලීය තේමාගත වැඩසටහන් සහ සාකච්ඡා ඇතුළුව රට තුළ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා දරන ප්‍රයත්නයට ශ්‍රී ලංකාව දායක වෙයි.[3] 2010 වර්ෂයේදී ශ්‍රී ලංකාව, ළමා ශ්‍රමය පිළිබඳ වඩාත් අනර්ථකාරී ස්වරූපයන් තුරන් කිරීමට ස්වකීය සහාය ලබාදීම පිණිස ප්‍රතිඥා දීම උදෙසා ගෝලීය ප්‍රජාව සමඟ සම්බන්ධ විය. එහි ජාතික ප්‍රයත්නයන්, ගෝලීය දැනුම හා රට තුළ වූ ළමා ශ්‍රමයෙහි වඩාත් අනර්ථකාරී ස්වරූපයන් ප්‍රමුඛ කර ගනිමින් ළමා ශ්‍රමය අවසන් කිරීමෙහි ප්‍රගතිය සඳහා දායක වී තිබේ. හවුල්කාරත්වය, සහයෝගී සැලසුම් හා ක්‍රියාමාර්ග සහ අන්‍යොන්‍ය වගකීම් තුලින් ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය (NPECL) හා එහි ක්‍රියාත්මකභාවය  නව ජවයකින් ක්‍රියාත්මක වනු ඇත.

# 02

## ළමා ශ්‍රම තත්ත්වය

ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණ (CAS) වාර්තාව, නීත්‍යානුකූල හා තහනම් කළ යන දෙවර්ගයෙහිම ළමුන්ගේ වැඩ (රැකියා) පිළිබඳ ඇස්තමේන්තු සපයයි. වර්තමාන වාර්තාවෙන් මෙන්ම එක් කාල පරිච්ඡේදයක සිට තවත් කාල පරිච්ඡේදයකට පවතින නැඹුරුතාවයන්ගෙන් ලබා ගන්නා තොරතුරු, භූගෝලීය ප්‍රදේශවලට ප්‍රමුඛතාව දීමට සහ කඩිනම් ප්‍රතිචාරාත්මක මැදිහත්වීම් අවශ්‍ය වන ගැටළු ස්වරූපයන්ට සහාය වීම පිණිස භාවිතා කරනු ඇත. උදාහරණයක් වශයෙන් අනර්ථකාරී ළමා ශ්‍රම ගැටළුවලට පිළියම් යෙදීමට සහ රැකියා නියුක්තිය සඳහා වූ නීත්‍යානුකූල වයසෙහි තරුණ පුද්ගලයන් ආරක්ෂා කිරීමත් ය.[4]

ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණ සඳහා දත්ත රැස්කරගනු ලබන්නේ අනර්ථකාරී ළමා ශ්‍රම ඝණය ආශ්‍රිතවය. වෙනත් ඝණයන්හි පවතින ළමා ශ්‍රමයේ සියළු ස්වරූපයන් ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රයත්නයන් දැරීම අවශ්‍ය වේ. එමඟින් ලබා ගන්නා තොරතුරු, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එක්රැස් කර ගනියි.

ඇතැම් ආර්ථික අංශ විසින් ළමා ශ්‍රමය විශාල වශයෙන් පොළඹවාගෙන යොදා ගනු ලබයි. මේවා අතර ශ්‍රී ලංකාවේ ධීවර, සංචාරක, කුඩා හා පෞද්ගලික වතු සහ ගෘහස්ථ ශ්‍රමය දක්නට ඇත. මසුන් ඇල්ලීම හෝ ධීවර කටයුතු, කෘෂිකාර්මික අංශයට ඇතුළත් වේ. 2010 ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපයන්හි ලැයිස්තුව මඟින්, මසුන් ඇල්ලීම/ධීවර කටයුතුවල ළමයින් යෙදවීම ළමුන් අවධානමට ලක් කරනු ලබන ක්‍රියාකාරකම් ලෙස හඳුනා ගෙන ඇති බැවින් එය තහනම් කර ඇත. සංචාරක කර්මාන්තය තුළ විශේෂයෙන්ම තරුණ පිරිමි ළමයින් ලිංගිකව සූරා කෑමට ලක්වීම ප්‍රශ්නයකි. සංචාරක ක්ෂේත්‍රය සීඝ්‍රයෙන් වැඩිදියුණු වීම සහ එම ක්ෂේත්‍රය තව දුරටත් පුළුල් කිරීමට පියවර ගෙන තිබීම නිසා බලවත් සැලකිල්ලක් යොමු කිරීම අතිශයින්ම වැදගත් වේ. ප්‍රධාන

---

1 ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව කැඳවනු ලැබීම හා එහි සභාපති ධුරය දැරීම, කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලබන අතර, එය ප්‍රධාන රේඛීය දෙපාර්තමේන්තු, සේව්‍ය හා සේවක සංවිධානවල සහ සිවිල් සමාජයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

2 ළමා  ශ්‍රමයෙන් තොර වූ කලාප ඇති කිරීමෙන් ළමා ශ්‍රමයේ වඩාත් අනර්ථකාරී ස්වරූපයන් තුරන් කිරීම සඳහා වූ දිස්ත්‍රික් ප්‍රධාන ප්‍රවාහයේ ක්‍රමෝපායන් තුළින් රත්නපුර ළමා ශ්‍රම නිදහස් කලාප වැනි දිස්ත්‍රික් ආදර්ශ පරීක්ෂා කිරීම පිණිස වූ ක්‍රියාමාර්ගවලට මුලපිරිණි.

3 ළමා ශ්‍රමය පිළිබඳ 2010 තෙවැනි ගෝලීය සම්මේලනය (හේග්) සහ 2013 සිව්වැනි ගෝලීය සම්මේලනය (බ්‍රසීලය) සඳහා ශ්‍රී ලංකාව සහභාගි විය.

4 ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, (2008/2009)  වාර්තාවට අනුව සංඛ්‍යාලේඛන හා තොරතුරු මගින් ළමා ශ්‍රමය සම්බන්ධයෙන් විශේෂයෙන්ම (වඩාත් අනර්ථකාරී ස්වරූපවලින් එකක් වන) 64,000 ක් පමණ වන අනර්ථකාරී ළමා ශ්‍රමයෙහි නිරත ළමුන්, 100,000 පමණ වූ ළමා ශ්‍රමයෙහි නිරත ළමුන් හා වයස අවුරුදු 5-17 දක්වා වූ තරුණ පුද්ගලයන් ඇතුළත්ව විසඳුම් සෙවීම සඳහා හදිසි පියවරවල අවශ්‍යතාව අවධාරණය කරනු ලබයි. (එනම් මිලියන 4.3 ක් ඉක්ම වූ මුළු ප්‍රමාණයෙන් 2.5% ක් වන) (සමීක්ෂණයේ කාර්යරාමුව මගින් සේවා නියුක්තියේ වන ළමුන් පිළිබඳ නීත්‍යානුකූල නිර්වචනය ඉක්මවා තිබේ. එම නිසා ඇස්තමේන්තුගත සංඛ්‍යාවන් තරමක වෙනස් වූ තත්ත්වයක් පවතී.)

නියෝජිතායතන හා පාර්ශවයන් සමග වූ සම්බන්ධතා ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් සහතික කරනු ඇත. එමඟින්, ළමයින් සඳහා සමායෝජිත ප්‍රතිචාරවලට මඟ පෙන්වනු ඇත.

ප්‍රාදේශීය වැවිලි සමාගම් විසින් ළමා ශ්‍රමය ශූන්‍ය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් (Zero tolerance policy) අනුගමනය කර ඇති අතර එමඟින් සේවා නියුක්තියේ අවම වයස අවුරුදු 16 හෝ 18 දක්වා වැඩි කර ඇත. නමුත් කුඩා සහ පෞද්ගලික වතුවල ළමා ශ්‍රමය ප්‍රශ්නයකි. කුඩා සහ පෞද්ගලික වතුවල පවතින ගැටළු සඳහා විසඳුම් සෙවීම පිණිස තොරතුරු හා සම්පත් එකිනෙකට සම්බන්ධ කරලීමෙහිලා සහයෝගීතා හවුල්කාරත්වයක් ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් ගොඩනැගෙනු ඇත. මෙකී ගැටළු අතර ඉහළ දරිද්‍රතා අනුපාතය, වැඩිහිටි කම්කරුවන් අතර පවතින මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යන කරුණු කැපී පෙනේ. මෙම සාධක, පාසැල් හැරයාමේ අනුපාතිකය ඉහළ නැංවීම, ළමයින් නීති විරෝධී කටයුතු සඳහා යොදා ගැනීම හා ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශවල ළමුන් ගෘහ මෙහෙකාර සේවයේ යෙදීම, මාපියන් දෙදෙනාම රැකියා සඳහා පිටත්ව යාම හේතුවෙන් සහෝදර සහෝදරියන් රැකබලා ගැනීම යනාදියට දායක වේ[5]. ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය මඟින් පාසැල් නොපැමිණීමේ මූලික හේතු සාධක වශයෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඇති දුර්වල කාර්ය සාධනය, මූල්‍ය දුෂ්කරතා, ආබාධිතබව හා ළමුන් ආර්ථික කටයුතුවල නිරතවීම දැක්විය හැකිය. අංශ වශයෙන් ගත් කළ සංඛ්‍යාත්මක වශයෙන්, ආර්ථික දුෂ්කරතා නිසා පාසැල් හැර යන ළමයින් සංඛ්‍යාව වැවිලි අංශයේ ළමයින් අතර ඉහළම අගයක් ගන්නා බව සොයාගෙන ඇති අතර, ග්‍රාමීය අංශයේ ළමයින් අතර, ආර්ථික කටයුතුවල නිරතවීම ඉහළම අගය ගනී.[6] සමස්ථයක් වශයෙන් ගත් කළ පාසැල් නොපැමිණීම වැඩිතම අගය ඇත්තේ වැවිලි අංශයේ ළමයින් අතරය.[7] පෞද්ගලික වතුවල පවතින මෙම තත්ත්වයට දායක වන සාධකවල විසඳුම් සෙවීමේදී ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි දක්වා ඇති පරිදි ඒකාබද්ධ සහ මැනවින් ඉලක්කගත කළ ප්‍රතිපත්ති සහ මැදිහත්වීම් අවශ්‍ය වේ.

03

# නෛතික හා ප්‍රතිපත්ති කාර්යරාමුව

ශ්‍රී ලංකා රජයේ ජාතික සංවර්ධන සැලසුම්, නීති, ප්‍රතිපත්ති හා වැඩසටහන්, පෞද්ගලික ආයතන, සිවිල් සමාජ සංවිධාන සහ සමාජ ව්‍යුහය මඟින් ළමයින්ට පාසැල් යෑමට හැකිවන, ළමා ශ්‍රමයෙන් නිදහස්ව ජීවත්වීමට හා සමාජ ආරක්ෂණ පියවර මඟින් ඔවුන්ට හා ඔවුන්ගේ පවුල්වලට ප්‍රතිලාභ ලබා ගත හැකි පසුබිමක් නිර්මාණය කර ඇත. එසේ වුවද, ප්‍රතිලාභ, බාධක හා අභියෝග කැටුව එන වත්මන් ගෝලීයකරණය වූ ආර්ථිකය තුළින් ළමයින්ව ළමා ශ්‍රමය සහ එහි අනර්ථකාරී ස්වරූපයන් ඇතුළු ප්‍රචණ්ඩත්වයට හා ශ්‍රමය සූරාකෑමට ගොදුරුවීම වැඩිවීමේ අවදානමකට පත්ව තිබේ.

## 3.1 නෛතික කාර්යරාමුව

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව 12 (1) වගන්තිය යටතේ ස්වකීය ජනතාවට සමානාත්මතාවට හා වෙනස් ලෙස නොසැලකීමට ඇති අයිතිය පිළිබඳව සහතිකයක් ලබා දෙයි. එය ශාරීරික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සමාජ සංවර්ධනය සහතික කිරීම පිණිස ළමුන්ගේ හා තරුණ පුද්ගලයන්ගේ යහපත ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රමය සූරාකෑමෙන් හා වෙනස් ලෙස සැලකීමෙන් ආරක්ෂා කිරීම ද රාජ්‍ය ප්‍රතිපත්තියේ මූලධර්මයන් 27 (13) ව්‍යවස්ථාව යටතේ රජයේ වගකීම ද එලෙසම හඳුනා ගනියි.

1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීමේ පනත මඟින් ළමයින්ගේ හා තරුණ පුද්ගලයන්ගේ වැඩ, වැඩ කරන කාලය හා කොන්දේසි නියාමනය කරනු ලබයි. පනත මඟින් ළමයෙකු යනු වයස අවුරුදු 14 ට අඩු පුද්ගලයෙකු වශයෙන් ද, තරුණ පුද්ගලයෙකු යනු වයස අවුරුදු 14 ට එළඹුණු හා අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු වශයෙන් ද නිර්වචනය කරනු ලැබේ.[8] 2001 වර්ෂයේ මාර්තු මස පිළිගනු ලැබූ අංක 182 වන ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතියෙහි 3(ඈ) ව්‍යවස්ථාව යටතේ වූ රජයේ බැඳීම සපුරාලීමෙහිලා

---

[5] විශේෂයෙන්ම කුරුඳු, කජු හා තල් වැනි කුඩා තේ වතු හිමිකරුවන් නොවන වතු ඇතුළු පෞද්ගලික වතුවල ශ්‍රමය හා ළමා ශ්‍රමය සම්බන්ධ කොන්දේසි පිළිබඳ දත්ත විරලය.
[6] ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2008/2009 (ශ්‍රී ලංකාව) (පිටු 21-24)
[7] පූර්ව ජන හා සංඛ්‍යා ලේඛන සමීක්ෂණය 2008/2009 (පිටු 22)
[8] 2000 ජනවාරි 20 වැනි දින අංක 1116/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය

සේවයේ නියුක්තවීමේ අවම වයසට වැඩි ළමයින් ආරක්ෂා කිරීම පිණිස ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ ලැයිස්තුවක් 2011 වර්ෂයේ මාර්තු මස අංක 1695/32 ගැසට් නිවේදනයට අනුව කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ 2010 රෙගුලාසි මඟින් නිර්ණය කර තිබේ. වෙනත් නීති ගණනාවක් රටෙහි ළමා ශ්‍රම තත්ත්වය සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍රව බලපෑම්කර තිබේ.

අනර්ථකාරී ළමා ශ්‍රමය හෝ, "එහි ස්වභාවයන් හෝ එය සිදුකරගෙන යනු ලබන තත්ත්වයන් තුළ ළමයින්ගේ සෞඛ්‍යයට, ආරක්ෂාව හෝ සදාචාරයට හානිකර විය හැකි වැඩ"[9], 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත හරහා ඍජුව ළමා ශ්‍රම ගැටළුවට විසඳුම් සෙවීම පිණිස, කම්කරු අමාත්‍යාංශය ස්වකීය බලතල යොදා ගනී.

1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනතෙහි හා 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනතෙහි ද ළමයින් සේවයේ යෙදවීම පිළිබඳව ප්‍රතිපාදන පනවා තිබේ. 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයින් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනතට අනුරූපතාවකින් යුක්තව පසුව දක්වා ඇති පනතේ සේවයේ නියුක්ත වීමේ අවම වයස සඳහන් වන අතර, කලින් දක්වා ඇති පනත මඟින් සේවයේ නියුක්ත වීමේ අවම වයසට වැඩි ළමා කම්කරුවන් සඳහා ගෙවීම, අතිකාල හා නිවාඩු නියාමනය කරනු ලබයි.

අවිධිමත් ක්ෂේත්‍රය තුළ ළමා ශ්‍රමය භාවිතය පිළිබඳව සලකා බලන විට ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් ආවරණය කරනු ලබන දණ්ඩ නීති සංග්‍රහය[10] ක්‍රියාකරන්නාක් මෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට සහාය වෙමින් අවිධිමත් ක්ෂේත්‍රය[11] තුළ ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන්හි සහ ළමා ශ්‍රමයෙහි විෂය සීමාවේ සිද්ධි නීතිය හමුවට ගෙන ඒම පිණිස 1941 අංක 24 දරණ දරුවන් හදා වඩා ගැනීම පිළිබඳ ආඥා පනත, 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත, 1939 අංක 28 දරණ තරුණ වරදකරුවන් (පුහුණු පාසල) පිළිබඳ ආඥා පනත සහ 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ පනත සතුව ප්‍රමාණවත් තරම් පුළුල් විෂය පථයක් තිබේ.

ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් හා ළමා ශ්‍රමයේ වෙනත් ස්වරූප ඉලක්ක කිරීම අනුව කම්කරු අමාත්‍යාංශය, 1999 අංක 182 දරණ ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූප පිළිබඳව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතියෙහි විශේෂයෙන් සඳහන් කර ඇති ළමා ශ්‍රමයෙහි ඝණයන් සඳහා විශේෂිත පැවරූ කාර්යභාරයන් සහිත අමාත්‍යාංශ සමඟ ළමා ශ්‍රමය වැළැක්වීම හා තුරන් කිරීම සඳහා වගකීම දරයි.

ළමයින් විකිණීම හා නීති විරෝධී කටයුතු සඳහා යොදා ගැනීම, ණය සඳහා දාසකමට සහ ප්‍රවේණිදාසකමට ගැනීම වැනි (සියළු ස්වරූපයේ) වහල් සේවය හෝ වහල් සේවයට සමාන ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ ප්‍රායෝගිකව අත්විඳිය නොහැකි අතර, සන්නද්ධ අරගලවලදී යොදාගැනීම පිණිස ළමයින් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් බඳවා ගැනීම ඇතුළු බලහත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය ද, ''ගණිකා වෘත්තිය, අසභ්‍ය නිෂ්පාදන හෝ අසභ්‍ය හැසිරීම් සඳහා ළමයෙකු යොදා ගැනීම, මිලට ගැනීම හෝ ලබාදීම, විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ නීතිවිරෝධී ලෙස විකිණීම වැනි නීති විරෝධී කටයුතු සඳහා ළමයෙකු යොදා ගැනීම, මිලට ගැනීම හෝ ලබාදීම'' ශ්‍රී ලංකාවේ ප්‍රායෝගිකව අත්විඳිය නොහැකිය. කෙසේවෙතත් ළමා ශ්‍රමයෙහි එවැනි අනර්ථකාරී ස්වරූපයේ ගැටළු ඇතිවීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව සතුව නව ප්‍රවේශයක් තිබීම අවශ්‍ය වේ.

ළමා ශ්‍රමය පිළිබඳ තත්ත්වය මුලිනුපුටා දැමීම මත සිදුවන ඍජු හෝ වක්‍ර බලපෑම පරීක්ෂා කිරීම පිණිස අවශ්‍ය වන අනෙකුත් නීතිරීති පහත පරිදි වේ.

1841 අංක 4 දරණ අයාලේ යන්නන් පිළිබඳ ආඥා පනත, 1889 අංක 19 දරණ නඩත්තු ආඥා පනත, 1939 අංක 48 දරණ ළමයින් හා තරුණ පුද්ගලයන් පිළිබඳ ආඥා පනත (CYPO), 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක (සේවා නියුක්ති රෙගුලාසි හා පරිශ්‍රමික) පනත, 1956 අංක 48 දරණ ළමයින්ගේ හා තරුණ පුද්ගලයන්ගේ (හානිකර ප්‍රකාශන) පනත මෙන්ම පතල් හා ඛණිජ පිළිබඳ පනත, පුපුරන ද්‍රව්‍ය පිළිබඳ පනත, 1935 අංක 14 දරණ වෘත්තීය සමිති ආඥා පනත, ගණිකා නිවාස ආඥා පනත සහ අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත ද මීට අයත්ය.

දණ්ඩ නීති සංග්‍රහයේ 360(අ), 360(ආ) සහ 288(අ) වගන්ති (සංශෝධිත පරිදි) මඟින් ගණිකා වෘත්තිය සඳහා වයස අවුරුදු 18 ට අඩු බාල වයස්කරුවන් යොදා ගැනීම, මිලදී ගැනීම හෝ මුදලට ලබාදීම තහනම් කිරීම ඇතුළු

---

9 1999 (අංක 182) ළමා ශ්‍රමයේ වඩාත් අනාර්ථකාරී ස්වරූප පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතිය.

10 1995 අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධනය) 358 සහ 360(ඉ) වගන්ති.

11 ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 33වැනි වගන්තිය යටතේ, පොලිස් වරෙන්තුවක් නොමැතිය වුවද, එහෙත් නිළධාරියෙකුට හෝ අධිකාරියකට දෙනු ලබන ලිඛිත උපදෙස් අනුව ප්‍රවේශ වීමට සහ පරීක්ෂා කිරීමට බලය අධිකාරියට පවරා තිබේ. මෙම අධිකාරියට ළමා අපයෝජන ආවරණය කිරීමට හෝ වෙනත් යම් නීත්‍යානුකූල අරමුණක් සඳහා ළමුන් ආවරණය කිරීමට බලය පවරා දී ඇත.

ගණිකා සේවය ආශ්‍රිත පුළුල් පරාසයක ක්‍රියාකාරකම් තහනම්කර තිබේ.

1995 අංක 22 දරණ පනත හා 1998 අංක 29 දරණ පනත මඟින් සංශෝධිත පරිදි දණ්ඩ නීති සංග්‍රහය, 1979 අංක 15 දරණ අපරාධ නීති සංග්‍රහය සහ 1995 අංක 20 දරණ සහ 1998 අංක 28 හා 29 දරණ සංශෝධිත පනත් මඟින්ද ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපයන් සහිත වූ ළමා ශ්‍රමය සඳහා තුඩු දෙන තත්ත්වයන් හා ක්‍රියාමාර්ග ඇතුලත්ව ළමා ආරක්ෂාව පිළිබඳ ගැටළු සඳහා විසඳුම් සොයනු ලබයි.

1998 අංක 01 දරණ අනිවාර්ය අධ්‍යාපනය පිළිබඳ පනත (185 පරිච්ඡේදය) මඟින් රටේ අධ්‍යාපන ප්‍රතිපත්තිය පැහැදිලි ලෙස මැනවින් සඳහන් කර ඇති අතර එය ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය පහළ මට්ටමක පැවතීමට දායක වී තිබේ. එකී පනත මඟින් 1945 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙමින් පවතින නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සවිබල ගන්වනු ලබයි. ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය 92%ක් වශයෙන් වාර්තා වී තිබේ. ශ්‍රී ලංකා රජය අනිවාර්ය පාසැල් පැමිණීමේ වයස අවුරුදු 14 සිට අවුරුදු 16 දක්වා වැඩි කරමින් අධ්‍යාපන ආඥා පනතෙහි 37 වන වගන්තිය යටතේ (185 පරිච්ඡේදය) 2015 අංක 01 දරණ ළමයින් අනිවාර්යයෙන් පාසලට පැමිණීමේ රෙගුලාසි 2016/04/20 දින අංක 1963/30 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළේය.

ඒ අනුව, සේවා නියුක්තියට අදාළ නීතියද වයස අවුරුදු 14 සිට අවුරුදු 16 දක්වා ඉහළ නැංවීම අවශ්‍ය වේ. මෙම සමාජ ප්‍රතිලාභ පවත්වා ගැනිම පිණිස එතකුදු වුවත්, ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී විවිධ ස්වරූපයන් සඳහා විසඳුම් සෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර වූ බලපෑමෙහි පැහැදිලි ඒකරාශී වීමක් සහිතව අන්‍යෝන්‍ය වශයෙන් සමීපව කටයුතු කිරීම අවශ්‍ය වේ.

## 3.2 ප්‍රතිපත්ති පසුබිම

ළමා ශ්‍රමයේ තත්ත්වයෙහි සහ ළමයින්ගේ ජීවිතවල වෙනසක් ඇතිකරන්නා වූ ප්‍රධාන ප්‍රතිපත්ති හා වැඩසටහන් රාශියක් තිබේ. මේවා විශේෂයෙන් ළමයින් හා ළමා ශ්‍රමය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති (ළමා ආරක්ෂාව, අධ්‍යාපනය, ළමා ශ්‍රමය) වන අතරම විශේෂිත ආර්ථික අංශ (අනෙකුත් දෑ අතර ධීවර කර්මාන්තය/ධීවර කටයුතු, වැවිලි/වතු, සංචාරක, ඉදිකිරීම් පිළිබඳ ප්‍රතිපත්ති වැනි) ඉලක්ක කරගත් හෝ ජනගහනයේ විශේෂිත උප කුලක (සමාජ සුභසාධනය හා තරුණ පුද්ගල සේවා නියුක්තිය වැනි ප්‍රතිපත්ති) ඉලක්ක කරගත් සහ සාමාන්‍ය ජනගහනය (ජාතික සංවර්ධනය, සේවා නියුක්තිය හා සෞඛ්‍ය) ඉලක්ක කරගත් විවිධ ප්‍රතිපත්ති ද වේ.

නිරීක්ෂණය කර ඇති පරිදි, ඒකාබද්ධ ප්‍රතිචාරයන්හි වෙනත් තීරණාත්මක සාධක ගණනාවක් කම්කරු අමාත්‍යාංශයේ වගකීම් යටතට නොවැටෙන නමුත් එය සෑම අවස්ථාවකදීම අවශ්‍ය සහාය, ස්වකීය අනුග්‍රහය සහ සහයෝගය දක්වනු ලබයි. එසේ කිරීම පිණිස, අමාත්‍යාංශය ප්‍රධාන ප්‍රතිපත්තිවල හා වැඩසටහන්වල ළමා ශ්‍රම ගැටළු හා ඊට සම්බන්ධ වැදගත් තොරතුරු නව ප්‍රවේශයකට යොමු කිරීමේ ක්‍රමෝපාය මත මූලිකව විශ්වාසය තබන අතර, ඒ තුලින්, ඒකාබද්ධ ප්‍රතිචාර හා තිරසාර බලපෑමක් සඳහා ජාතික, පළාත් හා දිස්ත්‍රික්ක මට්ටම්වලදී ඔවුන්ගේ සම්බන්ධීකරණයට අවශ්‍ය පහසුකම් සලසා දෙයි.

ඇමුණුම 1 හි වගුව මඟින් දැක්වෙන අදාළ අණපනත් බලාත්මක කිරීම සඳහා ඒ ඒ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට පැවරී ඇති කාර්යභාරයන් සම්බන්ධව දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. එසේම එය ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇති, ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ අංක 182 දරන සම්මුතියෙහි නිශ්චිතව දක්වා ඇති ළමා ශ්‍රම ඝණයන්හි අනර්ථකාරී ස්වරූප හතර, ප්‍රධාන අණපනත් සමඟ සහසම්බන්ධ කිරීමට ප්‍රයත්න දරයි.

2010 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජය ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් විසින් මඟපෙන්වනු ලැබූ අදහස් විමසීමේ ක්‍රියාවලියක පෙරමුණ ගෙන 2016 වර්ෂය වන විට ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් අවසන් කිරීම සඳහා වූ ගෝලීය ළමා ශ්‍රමය පිළිබඳ සම්මේලනයේ දී ප්‍රතිඥා දුන් අතර, ඊට සමගාමීව ඉතා ඉක්මනින් සියළු ආකාරයේ ළමා ශ්‍රම ස්වරූපයන් තුරන් කිරීම හා වැළැක්වීම උදෙසා කටයුතු කළේය. ඉලක්ක තවමත් සම්පූර්ණයෙන්ම සපුරාගෙන නොමැති අතර, ඉලක්ක සම්පූර්ණ වශයෙන් සාක්ෂාත් කරගත නොහැකි වූ අවස්ථාවක ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දැක්වෙන වැඩසටහන් සහ ඒවා හරහා ළමා ශ්‍රමය පිළිබඳ ගැටළුවලට පිළියම් යොදන ආකාරය පිළිබඳව වූ විවිධ ප්‍රතිපත්ති හා වැඩසටහන් සමාලෝචනය කිරීම ඇතුළුව උපාය මාර්ග සැලැස්මක් (Road map) සම්පාදනය කරන ලදී. අනතුරුව එහි නිර්දේශ මත පදනම්ව දිස්ත්‍රික්ක හරහා ප්‍රධාන ප්‍රවාහයට යොමුගත වීමේ ක්‍රමවේදයකට අවතීර්ණවීම සිදු වූ අතර, ඉලක්ක සපුරා ගැනීමෙහිලා පාලනයන් පවත්වා ගැනීමට ඉවහල්වන අයුරින් ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම පිණිස ශක්තිමත් පදනමක් සැලසුණි.

2009 වර්ෂයේ දී ගැටුම් අවසන් වීම නිසා දේශපාලන වාතාවරණය, සාමය හා ස්ථාවරභාවය රට තුළ ඇති වී තිබේ. තාක්ෂණික සහාය ඇතුළු අවශ්‍ය සහාය සැලසෙන්නේ නම්, ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් මුලිනුපුටා දැමීම සපුරාලීම කළ හැකිය. තිරසාර ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති තුළින් ළමා ශ්‍රමය සම්බන්ධයෙන් සාමූහිකව විසඳුම් සොයන්නේ නම් රටේ සමාජ ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරාගත හැකි බව හඳුනා ගනියි.

ළමයින් පිළිබඳ ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සහ රටේ සංවර්ධන අභිලාෂයන් මෙන්ම ළමයින් පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර බැඳීම මත පදනම් වන යාවත්කාලීන වූ නීති හා ප්‍රතිපත්ති සහ ඒවායේ ක්‍රියාත්මකභාවය ළමා ශ්‍රමය පිළිබඳ ගැටළුව කෙරෙහි ආමන්ත්‍රණය කිරීමේදී අතිශයින් වැදගත් වේ.

# 04



## ප්‍රතිපත්ති පරමාර්ථ

සඵලදායි බලාත්මක කිරීම, ප්‍රධාන සංවර්ධන ප්‍රතිපත්ති හා වැඩසටහන්වලදී ළමා ශ්‍රමය පිළිබඳ ගැටළු ප්‍රධාන ප්‍රවාහයට ඇතුලත් කිරීම, ජාතික හා පළාත් මට්ටම්වලදී ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සහයෝගීව කටයුතු කිරීම, විශේෂයෙන්ම ශ්‍රී ලාංකික තරුණයන්ට උචිත වැඩ සඳහා තිරසාර ප්‍රවේශයක් ඇති කර ඊට පහසුකම් සැලසීම තුළින් ළමා ශ්‍රමයෙහි අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳව ප්‍රමුඛත්වය දෙමින් ළමා ශ්‍රමය අවසන් කිරීම හා වැළැක්වීම පිණිස ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය දායකත්වය ලබා දෙයි.

# 05



## ප්‍රතිපත්තියෙහි විෂය පථය

ළමා ශ්‍රමය පිළිබඳ ගැටළුව, බහු-ආංශික ගැටළුවලින් සමන්විතය. එබැවින් බහු-ආංශික ආයතනවල දායකත්වය සහිත බහු-ආංශික විසඳුම් අවශ්‍ය බව හෙළි වී ඇත. ගෘහස්ථ දරිද්‍රතාව, සමාජ ආරක්ෂණ පියවර නොමැතිකම, ළමයින් තුළ ඇතිවන කම්පන, පාසැල් සඳහා ප්‍රවේශයක් නොමැතිවීම නිසා ළමයින් සේවා ස්ථානවලට තල්ලු වීම, ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල පවතින අනාරක්ෂිත ප්‍රවේශ ස්ථාන හා නාගරික ආර්ථිකයන් මඟින් මෙම අනාරක්ෂිත ළමයින් ලාභදායි, අඩු කුසලතා සහිත සහ නූගත් කම්කරුවන් වශයෙන් අන්තර්ග්‍රහණය කර ගැනීම, ප්‍රමාණවත් නොවූ කම්කරු පරිපාලනය සහ පරීක්ෂණ ක්‍රමවේදයන් යනාදිය ළමුන්ට තහනම් කරන ලද හා අනතුරුදායක කාර්යයන්හි නියුක්ත වීමට පෙළඹවීමක් ඇති කරයි.

වෙනත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය පිළිබඳ ගැටළුව ජාතික මට්ටමේ විවිධ අමාත්‍යාංශ සහ එකී අමාත්‍යාංශයන්හි පළාත් හා දිස්ත්‍රික්ක මට්ටම්වල පවතින ඒ ඒ දෙපාර්තමේන්තු හා කාර්යාලවලට පැවරී තිබෙන කාර්යභාරය යටතට ඇතුළත් වේ. විශේෂයෙන්ම, 2011 මාර්තු මස අංක 1695/32 දරණ අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි (පනතේ 20(අ) වගන්තියට අදාලව) ඇතුළුව 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම නියාමනය කිරීම සඳහා වූ පනත ක්‍රියාත්මක කිරීමට අදාළ වන පරිදි *මෙම ප්‍රතිපත්තිය කම්කරු අමාත්‍යාංශයේ සෘජුව මැදිහත්වීම යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.*

*ළමා ශ්‍රමය සම්බන්ධයෙන් බලපෑමක් ඇති කරන්නා වූ වෙනත් නීති, පොදු ප්‍රතිපත්ති හා වැඩසටහන්වලට අදාළ හවුල්කාරත්වයන් හරහා ද ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබයි.* මේවා අතර කර්මාන්තශාලා ආඥා පනත, සාප්පු හා කාර්යාල සේවක පනත, පඩි පාලක සභා ආඥා පනත, ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත, දණ්ඩ නීති සංග්‍රහය, අනිවාර්යෙන් පාසලට පැමිණීමේ රෙගුලාසි සහ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනත වේ. අධිකරණ, සමාජ සුභසාධන, පොලිස්, පරිවාස හා ළමාරක්ෂණ, ළමා සංවර්ධන, අධ්‍යාපනය, සේවා නියුක්තිය, සෞඛ්‍ය හා තරුණ කටයුතු යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ බලය පවරනු ලැබූ අමාත්‍යාංශ හා ඒවායේ ආයතන ඇතුළත් වූ නමුත් ඒවාට සීමා නොවන පරිදි වෙනත් ආයතන සමඟ ද සහයෝගීව කටයුතු කිරීම අවශ්‍ය වේ.

*ප්‍රතිපත්තිවලට අදාළ හවුල්කාරත්වයන් සහ සේව්‍ය හා සේවක සංවිධානවල කටයුතු, ආංශික රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් සහ නියෝජිතායතනයන්හි කටයුතු හරහා ද ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එලෙසම ක්‍රියාත්මක කරනු ලබයි.*

# 06

## ප්‍රතිපත්තියෙන් ප්‍රතිලාභ ලබන්නන්

ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස, කම්කරු අමාත්‍යාංශයත් අනෙකුත් පාර්ශවකරුවනුත් විසින් ගනු ලබන පියවරවල ප්‍රතිඵලයක් වශයෙන් 100,000 පමණ ඉක්මවූ ළමයින් පිරිසක් මෙමඟින් ඍජුව ප්‍රතිලාභ ලබන බවට ඇස්තමේන්තු කර තිබේ. එසේම, ළමුන් විශාල ප්‍රමාණයක් ළමා ශ්‍රමයට ප්‍රවේශවීමෙන් වළක්වාලනු ඇත.[12]

- පළමුව හා මූලික වශයෙන් අනර්ථකාරී රැකියාවල නිරතව ඇතැයි කියනු ලබන, ආසන්න වශයෙන් 64,000 ක් වූ ළමුන් අනර්ථකාරී රැකියාවලින් මුදවාලනු ලබන අතර යෝග්‍ය අධ්‍යාපනයකට, පුහුණුවකට, පුනරුත්ථාපනයකට සහ සමාජගත කිරීමේ සේවාවලට සම්බන්ධ කරනු ඇත.
- නීති විරෝධී කටයුතු සඳහා යොදාගැනීමෙහි ගොදුරු බවට පත්වී සිටින හෝ ළමුන් විකිණීම හෝ නීති විරෝධී කටයුතු සඳහා යොදා ගැනීම සහ බලහත්කාරයෙන් වැඩ ගැනීම හෝ අනිවාර්යයෙන් ශ්‍රමය ලබා ගැනීම වැනි අවදානම්වලට මුහුණ දී සිටින ළමුන්,
- ගණිකා වෘත්තියෙහි හෝ අසභ්‍ය නිෂ්පාදන හෝ අසභ්‍ය ක්‍රියාවන්හි ගොදුරු බවට පත්වී සිටින ළමුන්, සහ
- විශේෂයෙන් මත්ද්‍රව්‍ය, මධ්‍යසාර හා වෙනත් නීතිවිරෝධී ද්‍රව්‍ය නිෂ්පාදනය සහ නීතිවිරෝධී ලෙස විකිණීම ඇතුළු ක්‍රියාකාරකම්වල යෙදී සිටින ඇස්තමේන්තු නොකළ ළමුන්.

තරුණ පුද්ගලයින් සහ ළමා ශ්‍රමයෙන් තොරවීම යන්න සාක්ෂාත් කර ගැනීමේදී, එයින් ඇතිවන බලපෑම් තිරසාරව සහතික කෙරෙන ඵලදායි පාලන පද්ධති මෙන්ම උගත්, කුසලතා සපිරි සහ දක්ෂ ශ්‍රම බලකායක් සහිත ව්‍යාපාර මෙහි අනියම් ප්‍රතිලාභීන් වේ. වක්‍ර ප්‍රතිලාභ වශයෙන් තරඟකාරී හා දක්ෂතා සහිත ශ්‍රම බලකායකින් සමන්විත ව්‍යාපාර පැවතීම, ළමා ශ්‍රමයෙන් තොර තිරසාර වූ පාලන පද්ධතියක් බිහිවීම දැක්විය හැකිය.

# 07

## ක්‍රියාත්මක කිරීම

### 7.1 ආයතනික ව්‍යුහයන් සහ යාන්ත්‍රණ

ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ, අධීක්ෂණය කිරීමේ හා ඒ පිළිබඳ වාර්තා කිරීමේ මූලික වගකීම කම්කරු අමාත්‍යාංශය සතුව පවතී.

ජාතික මට්ටමේදී, කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතිත්වය දරන ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව (NSC), ළමා ශ්‍රම ගැටළුව පිළිබඳ සම්බන්ධීකරණ හා ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා උපදේශක ආයතනය වශයෙන් ද කටයුතු කරනු ඇත. ජාතික මෙහෙයුම් කමිටුව රජයේ, සේව්‍ය හා සේවක සංවිධානයන්ගේ සහ රාජ්‍ය නොවන සංවිධානයන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත

[12] අනර්ථකාරී රැකියාවල නිරත ළමයින් පිළිබඳ ඇස්තමේන්තු 2008/2009 ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය මත සකස්කොට තිබේ. ක්‍රියාත්මක කිරීමේ කාලය තුළදී පවතී නම් ප්‍රතිපත්තියෙහි ප්‍රතිලාභීන් ගැලපිය හැකිය.

වේ. එක්සත් ජාතීන්ගේ/ජාත්‍යන්තර නියෝජිතායතන, එනම් ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ යුනිසෙෆ් (UNICEF) සහ එවැනි වෙනත් ආයතන හෝ නියෝජිතායතන ජාතික මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි උපදේශක තත්වයෙන් කටයුතු කරනු ඇති අතර එවැනි වෙනත් කවර හෝ නියෝජිතායතනයක් ජාතික මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි ක්‍රියාකරනු ඇත. ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වය, ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් නැවත අලුත් කිරීමට ද සියළු අදාළ සංවිධාන සහ නියෝජිතායතන නියෝජනය වන බවට සහතික කිරීමට එකී සමාජිකත්වය නැවත ඇති කිරීමට ද කටයුතු කරනු ඇත.

කම්කරු අමාත්‍යාංශය යටතේ වූ කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අංශය විසින් අධීක්ෂණය කරනු ලබන්නා වූ *ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ ඒකකයක්* අමාත්‍යාංශය තුළ නම්කරනු ඇත. එය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ලේකම් කාර්යාලය වශයෙන් ක්‍රියාකරයි. තවද, එය පළාත් හා දිස්ත්‍රික් ව්‍යුහයන් සමග මෙන්ම අනෙකුත් පාර්ශවකරුවන් සමග සමීපව කටයුතු කරනු ඇති අතර දිස්ත්‍රික්ක 25 හි ළමා ශ්‍රම තත්ත්වයන් අධීක්ෂණය සඳහා සහ තත්ත්වය ඇගයීම සඳහා වගකිව යුතු වනු ඇත.

මෙම ඒකකයට එහි කාර්යයන් සිදුකරගෙන යාමට හැකිවන පරිදි අමාත්‍යාංශය, පළාත් සහ දිස්ත්‍රික්ක විසින් ඒකකය සමඟ සම්බන්ධතා, සම්බන්ධීකරණ, වාර්තා කිරීම පිළිබඳ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ඇත. ළමා ශ්‍රමය තුරන් කිරීමේ තත්ත්වයට එක් එක් දිස්ත්‍රික්කය එළඹෙන නිසා එකී තත්ත්වය ඇගයීමට ලක් කෙරෙනු ඇති අතර ක්‍රමවේද තහවුරු කිරීම මෙම ඒකකය මඟින් සිදුකෙරෙනු ඇත. ඉන්පසුව, ඒකකය විසින් එක් එක් දිස්ත්‍රික්කය ළමා ශ්‍රමයෙන් තොර බවට සහතික කර එකී  තත්ත්වය සම්පූර්ණයෙන්ම සුරක්ෂිත වන තුරු ඒ පිළිබඳ වාර්තා කිරීම අඛණ්ඩව සිදුකරගෙන යනු ඇත. ඒ අනුව, ජාතික මෙහෙයුම් කමිටුව, කොට්ඨාශය හෝ දිස්ත්‍රික්කය ළමා ශ්‍රමයෙන් තොර කොට්ඨාශයක් හෝ දිස්ත්‍රික්කයක් වශයෙන් උචිත පරිදි තීරණය කරනු ඇත.

*පළාත් මට්ටමේ දී,* ළමා ශ්‍රමය පිළිබඳ  ගැටළු පළාත් සංවර්ධන සැලසුම්වලට ඇතුලත් කරමින් ළමා ශ්‍රමයට එරෙහි ඒකාබද්ධ වූ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇත.

*දිස්ත්‍රික්ක මට්ටමේදී,* දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව විසින් ළමයින් හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ සම්බන්ධීකරණ කාර්යභාරයක් ඉටු කරනු ඇත.

දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුවේ සභාපති ලෙස, දිස්ත්‍රික් ලේකම්වරයාට දිස්ත්‍රික් සංවර්ධන සැලසුම්වලට ළමා ශ්‍රමය පිළිබඳ ගැටළු හා ඒ හා සම්බන්ධ වැදගත් කරුණු ඵලදායී ලෙස එක්කර ඇති බවට සහ දිස්ත්‍රික්ක මට්ටමේ ඉලක්කවලට ළඟා වීමට ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇති බවට සහතික විය හැකිය.

එක් එක් පළාත හා දිස්ත්‍රික්කය කම්කරු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එකී පළාත හා දිස්ත්‍රික්කය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සහාය දැක්වීම පිණිස වූ වඩාත්ම සාධනීය, ඵලදායි සහ සුදුසුතම ස්ථානය බවට පත් කර ගනු ලබයි.

## 7.2 පළාත්වල සහ දිස්ත්‍රික්කවල සම්බන්ධීකරණය

ප්‍රතිපත්තිය සාර්ථක වීමට නම්, එය දේශීය සන්දර්භය තුළ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්විය හැකි පුළුල් පරාසයක වූ හවුල්කරුවන් හා පාර්ශවකරුවන් මඟින් අන්තර්ජාතික තලයට ගෙන ආ යුතුය. ඒ සඳහා ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරි මට්ටමින් ආයතන අතර තිරස්ව හා සිරස්ව සම්බන්ධීකරණය සහතික කෙරෙනු ඇත. කම්කරු අමාත්‍යාංශය ඒ සඳහා අදාළ පළාත් හා දිස්ත්‍රික් බලධාරීන් සමඟ සම්බන්ධීකරණය හා සහයෝගීතාව සඳහා වූ යාන්ත්‍රණය ශක්තිමත් කෙරෙනු ඇත.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී කම්කරු අමාත්‍යාංශය විසින් කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, තරුණ කටයුතු හා කුසලතා සංවර්ධන අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, සේව්‍ය හා සේවක සංවිධාන, වැවිලි මානව සංවර්ධන භාරය, ගුරුවරුන් හා ඔවුන්ගේ සංවිධාන, පෞද්ගලික අංශය හා ඔවුන්ගේ සංගම්, පුහුණු විදුහල් හා වෘත්තීය පුහුණු සේවා සපයන්නන් සහ මාධ්‍ය යනාදී පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය හා දායකත්වය ලබා ගනු ඇත.

ප්‍රතිපත්ති සම්පාදනයේදී, සියලු අදාළ ප්‍රතිපත්තිවලට නව ප්‍රවණතාවක් ඇති කිරීමේදී හා ප්‍රතිපත්ති ගැළපීමේදී

ජාතික ආයතන ප්‍රමුඛ කාර්යභාර්යක් ඉටුකරන අතර, ප්‍රතිපත්ති බලාත්මක කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරි මට්ටමෙන් ප්‍රමුඛ කාර්යභාර්යක් ඉටු කරයි.

ජාතික මට්ටමේ ආයතන ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් මූලිකත්වය ගනු ලබන අතර ඒවා ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරි මට්ටමින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ඇත.

එක් එක් පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පළාත් හා දිස්ත්‍රික් බලධාරීන් විසින් පවතින හෝ නව කණ්ඩායම් සංවිධානය කරනු ලබන අතර එම කණ්ඩායම්වලට ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූලිකත්වය පවරනු ඇත. මෙම කාර්යයේදී ඒ ඒ බලධාරීන් අවශ්‍ය පරිදි කම්කරු අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයන් පවත්වනු ඇත.

මේවා, පවතින ළමා සංවර්ධන කමිටු හෝ ඒවායේ උප කණ්ඩායම් විය හැකිය. එමෙන්ම ඒවා බහු-ආංශික විය යුතු අතර, ළමා හා කාන්තා සංවර්ධන, කම්කරු, සෞඛ්‍යය හා සමාජ ආරක්ෂණ නිලධාරීන්ගෙන් මෙන්ම පොලිස් උපදේශකවරුන් සහ සේව්‍ය හා සේවක සංවිධානවල සහ සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතුය.

ළමා ශ්‍රමය පිළිබඳ ක්‍රියාකාරී මධ්‍යස්ථාන නිලධාරීන් ඔවුන්ගේ පළාත්වල හා දිස්ත්‍රික්කවල සිටින පළාත් දිස්ත්‍රික් පරිපාලකයන් විසින් පත් කරනු ලැබේ. ඔවුහු වැඩසටහන් හරහා ගැටළු විසඳීම සහ එම විසඳුම් ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා ආයතනික සම්බන්ධීකරණයට පහසුකම් සැපයීම පිණිස ළමා සංවර්ධන කමිටු/කණ්ඩායම් සමඟ එක්ව සහයෝගීව කටයුතු කරති.

## 7.3 සේව්‍ය හා සේවක සංවිධාන සමඟ හවුල්කාරත්වය

ළමා ශ්‍රමය අවසන් කිරීම හා වැළැක්වීම සහ සේවයේ යෙදවීමේ නීත්‍යානුකූල වයසෙහි පසුවන තරුණ කම්කරුවන් ආරක්ෂා කිරීම හා සහතික කිරීම සම්බන්ධයෙන් වගකීමක් ද ඒ සඳහා කටයුතු කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ද සේව්‍ය හා සේවක සංවිධාන සතු වෙයි.

ප්‍රතිපත්තියෙහි ළමා ශ්‍රම ගැටළුවලට හා ඊට සම්බන්ධ වැදගත් කරුණුවලට විසඳුම් සෙවීම, සේව්‍ය හා සේවක සංවිධානයන්ට පැවරී ඇති තීරණාත්මක කාර්යභාරයකි. කම්කරු අමාත්‍යාංශය සහ ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවෙහි සේව්‍ය හා සේවක නියෝජිතයන් විසින් පුහුණුව හා මේ සම්බන්ධයෙන් වූ ඉලක්ක හා එය ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සැලසීම ඇතුළුව විශේෂිත ක්‍රියාමාර්ග හඳුනා ගනු ලබයි.

පවුල්වල ආර්ථිකය සවිබල ගැන්වීම, සමාජ ආරක්ෂණ පියවර හා නීති, වැඩ කිරීමේ නීත්‍යානුකූල වයසේදී වැඩිමහලු ළමුන් ශ්‍රම බලකායට එක්වන බැවින් ඔවුන්හට ඉඩ ප්‍රස්ථාවන් හා සුදුසුකම් සඳහා තුඩුදෙන අධ්‍යාපනයකට/පුහුණුවකට හා වෙනත් සංවර්ධන සේවාවන්ට නිර්භාදිතව පරිවර්තනය කිරීම මඟින් ඵලදායි බලාත්මක කිරීම හා ළමා ශ්‍රමය වැළැක්වීම හා ළමුන් එයින් මුදා ගැනීමට හේතු වනු ඇත.

## 7.4 පෞද්ගලික අංශය සමඟ හවුල්කාරත්වය

රාජ්‍ය අංශයේ ආයතනයන් විසින් දරනු ලබන වගකීමට අතිරේක වශයෙන් පෞද්ගලික අංශයට ද ස්වකීය දර්ශනය තුළ ළමා ශ්‍රම ගැටළුව සමඟ කටයුතු කිරීම සඳහා ඔවුන්ගේ ඒ ඒ අංශ ඇතුළත ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ අවශ්‍ය පියවර ගැනීමේ වගකීමක් තිබේ. තවද, ජාතික නීති සමඟ අනුකූලත්වය සහතික කිරීමක් ද ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වය වැඩි කරමින් විධිමත් හා අවිධිමත් සැපයුම් දාමයේ අඩු වයස් ළමුන් නොමැතිව උගත් හා සුදුසුකම්ලත් ශ්‍රම බලකායන්ට දායකත්වය සැපයීමක් ද වනු ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රධාන අංශ ලෙස සංචාරක, ධීවර හා වැවිලි කර්මාන්තය දැක්විය හැකිය. කම්කරු අමාත්‍යාංශය සහ ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ සේව්‍ය හා සේවක නියෝජිතයන් විසින් මේ සම්බන්ධයෙන් පුහුණුව හා ඉලක්ක ඇතුළු විශේෂිත ක්‍රියාමාර්ග හඳුනා ගනු ලබන අතර, ඒවා ක්‍රියාත්මක කිරීම පිණිස පහසුකම් සපයනු ලබයි.

# 08

# ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රධාන උපාය මාර්ග

## 8.1 පුළුල් වූ ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සන්දර්භයක් තුළ නව ප්‍රවේශයක් ගොඩනැගීම

ළමුන්ගේ හා තරුණ පුද්ගලයන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවලට නව ප්‍රවේශයක් ඇති කිරීමට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීම සඳහා ජාතික සංවර්ධන ප්‍රතිපත්ති හා වැඩසටහන් සැලසුම් කිරීමේදී ඒ ඒ අයවැය තුලින් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සහ ඒ අනුව ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

ළමා ශ්‍රමය යනු හුදෙකලා සංසිද්ධියක් නොවන අතර ඒ නිසා පවුල් විසින් ආර්ථික වගකීම නිසි කලට පෙර ස්වකීය දරුවන් වෙත පැවරීමක් නොවන පරිදි දිළිඳුකම පිටුදැකීම සහ පවුල්වල ජීවන තත්ත්වයන් හා ආදායම් නංවාලන මෙම ප්‍රතිපත්තිවලට හා වැඩසටහන්වලට විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

**මේ සම්බන්ධයෙන්, විශේෂයෙන් වැදගත් වන්නේ,**

- ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය-2012 සහ යෞවනයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම-2006 යන මේවායින් නියම කර ඇති පරිදි වැඩිහිටියන් සඳහා උචිත වැඩ.
- පවුල්වල අවශ්‍යතා සඳහා ආධාර සැපයීම පිණිස "සමෘද්ධි" වැනි සමාජ සුභසාධන පියවර ව්‍යාප්ත වීම, ළමා ජීවිකාව සහතික කිරීම ඉලක්ක කර ගත් ළමුන්ගේ දීමනා ඇතුළු සමාජ ආරක්ෂණ හා පවුල් සුභසාධන පියවර.
- ළමුන්ගේ හා තරුණ පුද්ගලයන්ගේ අවශ්‍යතා සඳහා යෝග්‍ය අධ්‍යාපනය, වෘත්තීය හැඩගැස්වීම හා පුහුණුව සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම.
- ළමුන්ගේ හා තරුණ පුද්ගලයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය, තරුණ පුද්ගලයන් රැකියාගත කිරීම සහ ඔවුන් සංවර්ධනය කිරීම උදෙසා යෝග්‍ය හා ප්‍රමාණවත් පහසුකම්.

පවුල් නොමැති හෝ ඔවුන්ගේම පවුල් සමඟ ජීවත් නොවන අනාරක්ෂිත ළමුන්, හද්‍ර යෞවනයන්, සංක්‍රමණික හෝ නීති විරෝධී කටයුතුවල යෙදුණු ළමුන් සහ ළමා ශ්‍රමයෙහි යොදවනු ලැබීමෙහි අවදානම් සහිත ළමුන් කෙරෙහි ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය විශේෂ අවධානය යොමු කරයි.

## 8.2 සේවා නියුක්තිය සඳහා වූ අවම වයස වැඩිකිරීමට ප්‍රයත්න දැරීම.

1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයින් හා ළමුන් සේවයේ යෙදවීමේ පනතට අනුකූලව, ළමුන් හා වයස අවුරුදු 18ට අඩු තරුණ පුද්ගලයන් සඳහා ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අදාළ වේ. මෙම පනතට අනුව "ළමයකු යනු වයස අවුරුදු 14ට අඩු තැනැත්තෙකු වශයෙන් ද තරුණ පුද්ගලයකු යනු වයස අවුරුදු 14ට එළඹ ඇති නමුත් අවුරුදු 18ට අඩු යම් තැනැත්තෙක් වේ". අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි අදාළ වන්නේ ළමුන් හා වයස අවුරුදු 18ට අඩු තරුණ පුද්ගලයන් සඳහා වේ.

සේවා නියුක්තිය සඳහා වූ අවම වයස, අනිවාර්ය පාසැල් යාම සම්පූර්ණ වන වයසට වඩා, එනම් අවුරුදු 16ට අඩු නොවිය යුතුය. අනිවාර්ය අධ්‍යාපන වයස අවුරුදු 16 දක්වා ඉහළ නැංවීමත් සමඟ, කම්කරු අමාත්‍යාංශය, අනිවාර්ය පාසැල් යාම සම්පූර්ණ වන වයසට අනුකූලව සේවා නියුක්තිය සඳහා වූ අවම වයස සැකසීම පිණිස ක්‍රියාමාර්ග ගනු ඇත.

## 8.3 අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම.

කම්කරු අමාත්‍යාංශය, අවශ්‍ය අවස්ථාවලදී, විශේෂයෙන්ම රටේ දිනෙන් දින ඉදිරියට යන විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රගතිය හා වේගවත් සංවර්ධනය සැලකිල්ලට ගනිමින් අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි කාලානුරූපීව නැවත නැවතත් පරීක්ෂා කර සංශෝධනය කරනු ඇත.

පවුල් හා ප්‍රජාවන් ඉලක්ක කරගත් පොදු වැඩසටහන් හරහා අනර්ථකාරී රැකියා පිළිබඳ රෙගුලාසි සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇති කිරීම සේවා ස්ථාන හා ආංශිකව ක්‍රියාත්මක කරනු ලබන යාන්ත්‍රණය මඟින් සිදු කරනු ලැබේ.

## 8.4 සේවා නියුක්ති කොන්දේසි බලාත්මක කිරීම

1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමුන් සේවයේ යෙදවීමේ පනතෙහි විධිවිධාන සලසා ඇති පරිදි, අමාත්‍යාංශය මඟින් රැකියා කොන්දේසි ප්‍රවර්ධනය කිරීම හා බලාත්මක කිරීම සිදු කරනු ඇත. එසේම, අවිධිමත් සේවා ස්ථානවලට ද ප්‍රවේශවීමට හැකිවන පරිදි කම්කරු පරීක්ෂණ සඳහා තිබෙන අපහසුතා මඟහරවා ගැනීම පිණිස භාවිතය, ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම තුළින් එකී කොන්දේසි තවදුරටත් බලාත්මක වනු ඇත.

### 8.4.1 තරුණ පුද්ගලයින් පුහුණු කිරීම

තරුණ පුද්ගලයන්ගේ ආරක්ෂාව හා සංවර්ධනය සඳහා (වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ඇතුළත්ව) වෘත්තීය හෝ තාක්ෂණික අධ්‍යාපනය, පුහුණු ආයතන හා පාසැල් තුළින් යොමු කිරීම හා එහි ප්‍රමිතිය අමාත්‍යාංශය සහතික කරයි. වැඩකිරීමෙහි නීත්‍යානුකූල වයසෙහි පසුවන තරුණ පුද්ගලයන් සඳහා වූ කොන්දේසි සමීපව හා ක්‍රමිකව අධීක්ෂණය කළ යුතු අතර ළමුන් හා තරුණ පුද්ගලයන් ඇතුළු අදාළ සියළු දෙනාට යෝග්‍ය උපදෙස් සැපයිය යුතුය.

### 8.4.2 අන්තර් හා අභ්‍යන්තර නියෝජිතායතන ආශ්‍රිත සහයෝගිතා යාන්ත්‍රණ

සේවා ස්ථානයන්හි සිටින තරුණ පුද්ගලයන් එකී වයසෙහි වූ අනෙකුත් තරුණ පුද්ගලයන් මෙන් ළමා ආරක්ෂණය හා සුරැකීමේ සේවාවලින් ප්‍රතිලාභ ලබන බවට තහවුරු කර ගැනීමේ විශේෂිත වැදගත්කම ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය විසින් හඳුනාගනු ලබයි. මෙමඟින් ළමයින්ගේ හා තරුණ පුද්ගලයන්ගේ අධ්‍යාපනය, පුහුණුව, සුභසාධනය, මඟපෙන්වීම හා ආරක්ෂාව සඳහා වගකිව යුතු කම්කරු පරිපාලනය හා දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන අතර සමීප සහයෝගීතාවයක අවශ්‍යතාව උද්ගත වේ. මෙම අරමුණු සපුරා ගැනීම සඳහා අන්තර් නියෝජිතායතන සහයෝගීතාව පිණිස පැහැදිළි හා සරල යාන්ත්‍රණ ඇති කළ යුතුය.

## 8.5 බලාත්මක පද්ධතිය ශක්තිමත් කිරීම.

1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීමේ පනත සහ අනර්ථකාරී රැකියා රෙගුලාසි හා සෙසු අදාල ව්‍යවස්ථාපිත අණපනත්/නීති, ඵලදායී ලෙස යොදා ගැනීම, අධීක්ෂණය කිරීම සහ එහි ප්‍රතිඵල සහතික කෙරෙන පියවර ස්ථාපිත කිරීම පිණිස ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දීමට ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අදහස් කරනු ලබයි.

### 8.5.1 පුහුණුව

1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීමේ පනත මඟින් අවසර දෙනු ලැබ ඇති හා ළමයින් හා තරුණ පුද්ගලයන් සඳහා නීති ආධාර සපයන කණ්ඩායම් ඇතුළු ළමා ශ්‍රමය සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ පුද්ගලයන් හා කණ්ඩායම් සඳහා පුහුණු හා ප්‍රති-පුහුණු වැඩසටහන් පැවැත්වීම, සම්පත් හා උපකරණ සැපයීම යනාදිය තුළින් කම්කරු පරීක්ෂණ සහ ඒ හා සම්බන්ධ සේවාවන් ශක්තිමත් කරනු ඇත.

### 8.5.2 වයස තහවුරු කිරීම

සේවායෝජක ලේඛන මඟින් වයස තහවුරු කර ගැනීමට පවතින ක්‍රම ප්‍රායෝගික නොවන අවස්ථාවලදී, අදාළ නියෝජිතායතන සමඟ සහයෝගීව කටයුතු කිරීමෙන් විශ්වාසදායක ලෙස වයස තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කම්කරු අමාත්‍යාංශය කටයුතු කරනු ඇත. මෙහිදී අවිධිමත් ආර්ථික කටයුතුවල නිරත වන ළමුන්ගේ හා තරුණයන්ගේ වයස හා රැකියාව සඳහා යෝග්‍යතාව තහවුරු කර ගැනීමට රජය මඟින් ජාතික හැඳුනුම්පත් හා වෙනත් අදාල ලේඛන නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

### 8.5.3 කම්කරු පරීක්ෂණ සඳහා ඒකාබද්ධ ප්‍රවේශය

කම්කරු පරිපාලනය, ළමයින් හා සම්බන්ධ වෙනත් පරීක්ෂණ සිදුකරන ආයතන සහ සේවා සපයන්නන් විශේෂයෙන්ම තරුණ පුද්ගලයන් සඳහා අධ්‍යාපනය, පුහුණුව, සුභසාධනය හා සේවා සැපයීම සම්බන්ධයෙන්

වගකිවයුතු පුද්ගලයන් හා ආයතන සමග සමීප සහයෝගීතාවයකින් කටයුතු කරනු ඇත. සීමාසහිත වූ සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට සහ විෂය පථය හා ආවරණය කරනු ලබන ප්‍රමාණය පුළුල් කිරීම පිණිස ප්‍රජා නියාමන පද්ධති සමග සම්බන්ධතාවයන් ඇති කිරීම තුළින් ද ඔවුන්ට ප්‍රතිලාභ සැලසෙනු ඇත.

### 8.5.4 නඩු පැවරීම කාර්යක්ෂම කිරීම හා දඬුවම් පැමිණවීම

නීති විරෝධීව ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් කාලීනව නඩු පැවරීම, දඬුවම් නියම කිරීම, එම ළමයින් පිළිගත් අධ්‍යාපන ධාරාවකට යොමු කරවීම හා ඊට අදාළ සියළු කටයුතු ඉටුකිරීමේ වගකීම කම්කරු අමාත්‍යාංශය හා එහි හවුල්කරුවන් වන පොලිස් දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය වැනි ආයතනවල වගකීම වේ.

### 8.6 පැමිණිලි ක්‍රියාපටිපාටීන් පවත්වා ගැනීම

ඒ ඒ නීතිවලට අනුව, පැමිණිලි ක්‍රියාපටිපාටි පවත්වා ගනු ලැබිය යුතු වන්නේය. නීතියේ විධිවිධාන කඩකිරීම්වලට ලක්වන පුද්ගලයන්ටද වෙනස් කොට සැලකීමෙන් සහ පළිගැනීමෙන් ආරක්ෂා කිරීම පිණිස විධිවිධාන සැලසෙනු ඇත. වෙනත් නියෝජිතායතන සමග සහයෝගීව උපකාරක සේවා ස්ථාපිත කිරීමට නියමිතය. නීතිය කඩ කරන්නන්ට එරෙහිව කටයුතු කිරීමෙහිලා ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ජාතික ළමාරක්ෂක අධිකාරිය (NCPA) කම්කරු අමාත්‍යාංශයේ කාර්යයන් පූරණය කරයි.

ශ්‍රමය සුරාකෑමේ රැකියාවලින් ළමුන් මුදාගැනීමට කම්කරු දෙපාර්තමේන්තුව හරහා අපරාධ නඩු විධාන සංග්‍රහය සහ ජාතික ළමාරක්ෂක අධිකාරි පනත  යටතේ බලය පවරා ඇති  පොලිසිය සහ ජාතික ළමාරක්ෂක අධිකාරිය සමග කම්කරු අමාත්‍යාංශය සමීපව කටයුතු කරයි.

# 09



## සන්නිවේදනය - ළඟාවීම හා පසුවිපරම

කම්කරු අමාත්‍යාංශය හා ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව ඔවුන්ගේ අදාළ අනුග්‍රාහකයන් හරහා ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කර එය ක්‍රියාත්මක කරයි. ජාතික මෙහෙයුම් කමිටුව වැඩිදුරටත් තොරතුරු හෝ අදහස් ව්‍යාප්ත කිරිමේ හා ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ඇත.

# 10



## සම්පත්

කම්කරු අමාත්‍යාංශය සහ ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුමේ සාමාජිකයන් සම්පත් යෙදවීම පිණිස සැලසුමක් සකස් කරනු ඇත. එමඟින් ළමා ශ්‍රම ගැටළුව ආමන්ත්‍රණය කිරීමට අදාල පවතින වැඩසටහන් මූල්‍යකරණය කිරීමටත් අවශ්‍ය පරිදි අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීමටත් බලාපොරොත්තු වේ.

ළමා ශ්‍රමය හා සම්බන්ධ විවිධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඒවා සමග සම්බන්ධතාවයක් ඇති තිරසාර සංවර්ධන ඉලක්ක සහ වෙනත් ප්‍රතිපත්ති රාමු සමග සම්බන්ධකොට විශ්ලේෂණය කිරීම තුළින් ජාතික සහ බාහිර වශයෙන් සම්පත් සංචලනය කිරීමට ඇති හැකියාව ශක්තිමත් කරනු ඇත.

# 11

## සමාලෝචනය සහ ඇගයීම

ප්‍රතිඵල සමාලෝචනය, ප්‍රගතිය තක්සේරු කිරීම සහ අත්දැකීම් මත පදනම්ව අවශ්‍ය ගැලපීම් සිදුකිරීම පිණිස කම්කරු අමාත්‍යාංශය විසින් වාර්ෂික පදනමක් මත ආයතනික අභ්‍යන්තර සමාලෝචනය සිදු කිරීමට නියමිතය.

# 12

## අවදානම් සහ අභියෝග

දිස්ත්‍රික්ක සහ ප්‍රජාවට, බලපෑමට ලක්වූ ළමයින්ට හා පවුල්වලට සේවා සැපයීමට හැකිවන පරිදි කම්කරු අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව විසින් කාර්යක්ෂම කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියක් සහ ඵලදායී, උපායමාර්ගික ප්‍රවර්ධනයක් හරහා සහයෝගය ලබාදෙනු ඇත.

විශේෂයෙන්ම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මූලික අදියරවලදී ඇතැම් කණ්ඩායම් හා ආයතන විසින් මුහුණ දෙනු ලබන අවදානම් හා අභියෝග ඇතුළත්ව සියලු අවදානම් සහ අභියෝග අවබෝධ කර ගැනීම හා කළමනාකරණය කර ගැනීම මත ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය රඳා පවතී.

ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා තිබිය යුතු හැකියාව, සම්පත් නොමැති රේඛීය දෙපාර්තමේන්තු හා නියෝජිතායතන, ළමයින් වැඩක යොදවනු ලබන සහ ළමා කම්කරුවන්ගේ සංචිතයක් තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි සේවායෝජකයන්, ළමයින්ගේ ඉපැයීම් මත විශ්වාසය තබා සිටින හා විකල්ප කිසිවක් නොමැති පවුල්, අතිරේක ළමුන් විශාල ප්‍රමාණයකට ඉඩ පහසුකම් නොමැති පාසැල්, වැඩකරන පරිසරයක් තුළ සිසුන් ඒකාබද්ධ කිරීමට සහ ඔවුන්ට සහාය වීමට නිපුණතාවයක් නොමැති ගුරුවරුන් හා පරිපාලකයන්, ප්‍රජාව පදනම් කරගත් ළමා ශ්‍රමය අධීක්ෂණය කිරීමේ පද්ධති ඇතුළු ළමා ආරක්ෂණ පද්ධති සඳහා සහාය දීම පිණිස හැකියාවන් හා යාන්ත්‍රණය නොමැති ප්‍රජාවන්, ස්වකීය පුහුණු නිර්නායක සම්පූර්ණයෙන් සාක්ෂාත් කර නොගත් තරුණ පුහුණුලාභීන්ගේ අවශ්‍යතා පිළිබඳ ගැටළුවලට විසඳුම් සෙවීමට උත්සුක වන කුසලතා පුහුණුව සපයන්නන්, සේවා නියුක්තිය සඳහා නීතියෙන් අවසර ඇති වයසෙහි පසුවන තරුණ කම්කරුවන් සඳහා වැඩ කිරීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීමට උවමනා සේවා ස්ථාන, ඒකාබද්ධ ප්‍රතිචාරයක් ලබාගැනීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති අනුකූලතාවයක් සහතික කිරීමේ උවමනාවක් දක්වන ප්‍රතිපත්ති සම්පාදකයින්, ස්වකීය සැලසුම්කරණයේදී, ක්‍රියාත්මක කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී හා වාර්තා කිරීමේදී ඒකරාශීවීමේ සහ ප්‍රමාණවත් නොවූ මෙවලම් හා දත්ත නොමැතිව පැනනැගෙන ළමා ශ්‍රමය පිළිබඳ තත්ත්වයන් මෙයට ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

# 13

## ප්‍රතිපත්ති සම්පාදනයේ බාධා

මෙම ප්‍රතිපත්ති ලේඛනයෙහි යොදාගනු ලැබූ දත්ත, ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ ''ළමා ක්‍රියාකාරකම් සමීක්ෂය 2008/2009'' ආශ්‍රයෙනි. සමීක්ෂණයෙහි දී ඇති අපේක්ෂිත ඇස්තමේන්තුවලින් සත්‍ය ඇස්තමේන්තු වෙනස් විය හැකිය.

සමීක්ෂණයට භාජනය වූ ජනගහනය වයස අවුරුදු 5-17 අතර වයස් කාණ්ඩයේ ළමයින් වූ අතර, ඒ අනුව සමීක්ෂණයට භාජනය වූ ජනගහනයෙන් 2.5% ක් වශයෙන් ඇස්තමේන්තු කරන ලද ළමා ශ්‍රම දායකත්වයෙහි නිරත මුළු සංඛ්‍යාව අපේක්ෂා කල පරිදි 4,338,709 විය. ''ළමා ශ්‍රමය'' වශයෙන් හඳුනා ගනු ලැබූ අවුරුදු 5-17 අතර, වයස් කාණ්ඩය පදනම් කරගනිමින් එළඹුණු මෙම සංඛ්‍යාව ළමයෙකු යනු "වයස 14 ට අඩු පුද්ගලයෙකු" වශයෙන් නිර්වචනය කරනු ලැබ ඇති 1956 අංක 47 දරණ කාන්තාවන්, තරුණ පුද්ගලයන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනතෙහි සඳහන් නිර්වචනයට අනුකූල නොවන බව අධ්‍යාහාරයෙන් අවබෝධ වේ. වලංගු නොවන සංඛ්‍යාවක් පිළිබිඹු කළ සමීක්ෂණය මත පදනම් වූ මෙම මූලික දෝෂය තක්සේරු කරනු ලබන අතර, අනාගත සමීක්ෂණවලදී ළමා ශ්‍රමය පිළිබඳ සත්‍ය සංඛ්‍යාවක් බැලීම පිණිස එකී දෝෂය නිවැරදි කිරීම අවශ්‍ය වේ.

# 14

## කාල සීමාව

ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, පරමාර්ථ සම්පූර්ණයෙන්ම සපුරා ගන්නා තෙක් අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියක් විය යුතුය. එකී ප්‍රතිපත්තිය රජයේ අනුමැතිය සහිතව ජාතික මෙහෙයුම් කමිටුව විසින් අවශ්‍ය පරිදි යෝග්‍ය ලෙස යාවත්කාලීන කිරීම, සංශෝධනය කිරීම හා යෝග්‍ය ලෙස සංස්කරණය කිරීම සිදු කළ යුතුය.



# ඇමුණුම - 1

## ප්‍රධාන ජාතික නීති සම්පාදනය පිළිබඳ දළ විශ්ලේෂණය, නීති පැණවීම බලාත්මක කිරීම සඳහා වූ පැවරුම් බලය සහිත ප්‍රධාන අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු

| ජාතික නීති සම්පාදනය | පනත ක්‍රියාත්මක කිරීම සඳහා වූ පැවරුම් බලය සහිත අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | ළමා ශ්‍රමය පිළිබඳ අනර්ථකාරී ස්වරූපයන්හි ප්‍රභේදයට වූ සම්බන්ධතාව |
|---|---|---|
| • 1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ පනත<br>• අවදානම් රැකියා පිළිබඳ රෙගුලාසි 2011 මාර්තු මස අංක 1695/32 දරණ ගැසට් නිවේදනය | කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධනය අමාත්‍යාංශය | එහි ස්වභාවයෙන් හෝ එය ක්‍රියාවට නගනු ලබන තත්ත්වයන් මගින් ළමුන්ගේ සෞඛ්‍යයට, සුරක්ෂිතතාව හෝ සදාචාරයට හානි විය හැකි වැඩ |
| • 2006 අංක 16 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධනය) පනතේ 385(අ) ඡේදය | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව | ළමුන් විකිණීම (සියළු ස්වරූපයෙන්) සහ ජාවාරම් සඳහා යොදා ගැනීම. බලහත්කාරයෙන් හෝ අනිවාර්ය බඳවා ගැනීම, අයථා ක්‍රියාකාරකම් ඇතුළු බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් ශ්‍රමය ලබා ගැනීම. |
| • 2006 අංක 16 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත 358-360, 360(ආ), 360(ඇ), 360(ඈ), 360(ඉ), සහ 288(අ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව | ගණිකා වෘත්තිය, අසභ්‍ය නිෂ්පාදන හෝ අසභ්‍ය රඟ දැක්වීම් සඳහා ළමුන් යොදා ගැනීම, ලබා ගැනීම හෝ ලබාදීම. |
| • 2006 අංක 16 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධනය) 360(ඈ) ඡේදය නීතිය යටතේ වරදක් වන කවර හෝ ක්‍රියාවක් තෙක්, වරද විස්තෘත ලෙස දක්වයි.<br>• අපරාධ නඩු විධාන සංග්‍රහය | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව | විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ විකිණීමේ අයථා ක්‍රියාකාරකම් සඳහා ළමයෙකු යොදා ගැනීම , ලබා ගැනීම හෝ ලබාදීම. |
| • ළමුන් (දරුකමට) හදා වඩා ගැනීමේ අඥා පනත | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | ළමුන් පිළිබඳ (සියළු ස්වරූපයේ) නීති විරෝධී වෙළෙඳාම් කටයුතු |
| • අධ්‍යාපන අඥා පනත, නීතිය යටතේ අනිවාර්ය පාසැල් යැවීම (2006) | අධ්‍යාපන අමාත්‍යාංශය | සියළු ස්වරූපයන් අදාල වේ; වැළැක්වීම සහ අධ්‍යාපනය |
| • ළමුන් සහ තරුණ පුද්ගලයන් පිළිබඳ අඥා පනත | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | සියළු ස්වරූපයන් ආවරණය වේ; රැකබලා ගැනීම සහ ආරක්ෂාවට අදාළව |




කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය
තැ.පෙ.1519, කම්කරු මහ ලේකම් කාර්යාලය
නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකථන - 011 2368609
ෆැක්ස් - 011 2368609
www.labourmin.gov.lk